ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025-12.16

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ඩී.එම්.ඩී. දිසානායක මිය<br>අංක 157,<br>ඉහළ යක්කුරේ<br>නුවරගල |
| වින්දිත | : | ආර්.එම්.මෙනුක අයෝධ්‍ය තත්සර |
| වගඋත්තරකාර පාර්ශවය | : | 1) චන්ද්‍රලාල් රාජපක්ෂ මයා<br>විදුහල්පති<br>පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලය<br>පළුදෙණිය<br>සිරිපුර.<br><br>2) එස්.එන්.එන්. ශිවන්ති පෙරේරා මිය (ගුරු)<br>පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලය<br>පළුදෙණිය<br>සිරිපුර.<br><br>3) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ<br>දිඹුලාගල කලාප අධ්‍යාපන කාර්යාලය<br>මනම්පිටිය. |



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලි අංකය : HRC/1637/25

පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද කරුණු

වර්ෂ 2025ක් වූ මැයි මස 31 වන දින පැමිණිලිකරු වන ඩී.එම්.ඩී දිසානායක යන අය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ තම පැමිණිල්ල ගොනු කරමින් පහත සඳහන් කරුණු කියා සිටී. පො/දිඹුලාගල සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ ඉගෙනුම ලැබූ ආර්.එම්.මෙනුක අයෝධ්‍ය තත්සර රත්නායක වන තම දරුවාගේ 2024 වර්ෂයේ ජුනි මස සිට හැසිරීමේ යම් වෙනස්කම් නිරීක්ෂණය වූ බවත්, නිතර හිසේ කැක්කුමක් බව පැවසීම, ඉක්මනින් කේන්ති යාම වැනි ලක්ෂණ ඔහුගෙන් දක්නට ලැබූ බැවින් වෛද්‍ය ප්‍රතිකාර ලබා දුන්නද සුවයක් නොවීම නිසා දරුවා පොලොන්නරුව පෞද්ගලික රෝහලක විශේෂඥ මානසික වෛද්‍යවරයෙකු හමුවට රැගෙන ගිය බව දක්වා ඇත. එහිදී දරුවා පන්තිභාර ගුරුතුමියගේ විවිධ ශාරීරික හා මානසික පීඩාවන්ට ලක්ව ඇති බවත් එම නිසාවෙන් දරුවාට මානසික අවපීඩන තත්වයක් ඇති වී තිබෙන බවත් දරුවාට වසරක කාලයක් ප්‍රතිකාර ලබා දිය යුතු බවටත් වෛද්‍යවරයා විසින් නිර්දේශ කරනු ලැබූ බවද කියා සිටී. තවද වෛද්‍යවරයා විසින් දරුවා සම්බන්ධයෙන් ළමා හා කාන්තා කාර්යාංශයට පැමිණිලි කරන ලෙස තමාට උපදෙස් ලබා දුන් බවටද කරුණු දක්වා ඇත.

තවදුරටත් පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත්තේ දරුවාගේ ගැටලුව සම්බන්ධයෙන් තමා විසින් පාසලේ විදුහල්පතිවරයා දැනුවත් කළ විට ඔහු විසින් එය පිළිනොගත් බවත් දරුවාගේ වෛද්‍ය වාර්තා හා ඒ පිළිබඳ සඳහන් කර ලිඛිත ප්‍රකාශයක් ලබා දෙන ලෙස විදුහල්පතිතුමා විසින් පැවසූ බවත් ඒ අනුව 2024/08/30 දින ලිඛිත ප්‍රකාශයක් සමඟ වෛද්‍ය වාර්තා විදුහල්පතිතුමා වෙත ලබා දුන් බවටත්ය. ඉන්පසුව දරුවා එම පාසලේ ඉගෙන ගැනීම ප්‍රතික්ෂේප කළ බැවින් දරුවා වෙනත් පාසලකට ඇතුළත් කිරීමට සිතා තමා 2024/10/04 වන දින විදුහල්පතිතුමා හමු වී දරුවාගේ අස්වීම ලිඛිතව ඉල්ලා සිටි බවත් එහිදී විදුහල්පතිතුමා විසින් දරුවා පාසලට ඇතුළත් කර ඇත්තේ මව වන බැවින් අස්වීම ලබා දිය හැක්කේ මවට යැයි ප්‍රකාශ කළ බවටත් කරුණු දක්වා ඇත. එසේම අස්වීමට හේතුව ලෙස පන්තිභාර ගුරුතුමියගේ විවිධ ශාරීරික හා මානසික පීඩාවන්ය යන්න සඳහන් නොකර පෞද්ගලික හේතුවක් මත දරුවා අස්කරගන්නා බවට ලිඛිතව දැනුම්දුන් පසු අස්වීම ලබා දෙන බවට විදුහල්පතිතුමා විසින් තමාහට පැවසූ බවද දක්වා ඇත. ඒ අනුව 2024/10/14 වන දින සිට 2024/10/23 දින දක්වා දරුවාගේ අස්වීම ඉල්ලා දරුවාගේ මව පාසලට ගියද ඒ සෑම අවස්ථාවකම විවිධ හේතු පවසමින් අස්වීම ලබා දීම පමා කළ බවට පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.

මේ අතරතුර 2024.10.11 දිනැතිව පාසලෙන් තමා හට ලිපියක් ලැබුණු බවත් එහි දරුවාගේ දෙමාපියන් විසින් දරුවාගේ පාසල් නොපැමිණීමට හේතුව මෙතෙක් පාසල වෙත දැනුවත් කර නොමැති බවට සඳහන්ව තිබූ බවටද කරුණු දක්වා ඇත. 2024/08/30 වන දින තමා විසින් තම දරුවාගේ වෛද්‍ය වාර්තාද ඇතුළුව ලිඛිත ප්‍රකාශයක් මඟින් පාසල දැනුවත් කර තිබියදීත් විදුහල්පතිතුමාගේ නිල මුද්‍රාව හා

අත්සන යොදා එවැනි ලිපියක් තමා වෙත යොමු කර තිබූ බව ප්‍රකාශ කර සිටී. එම ලිපියේ පිටපත් කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය,ග්‍රාම නිලධාරි (සිරිපුර), ළමා හා කාන්තා කාර්යාංශය (සිරිපුර), ළමා හා පරිවාස නිලධාරි (ප්‍රාදේශිය ලේකම් කාර්යාලය) ආදී ස්ථානවල ද යොමු කර තිබූ බවයි. ඒ අනුව 2024.10.26 වන දින සිරිපුර පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට තමා වෙත කළ දැනුම් දීම පරිදි බිරිඳ හා දරුවා සමඟ සිරිපුර පොලිස් ස්ථානයට ගිය බවත් එහිදී සියලු කරුණු විමසා බැලූ ස්ථානාධිපතිතුමා විසින් දරුවාට විශාල අසාධාරණයක් සිදුව ඇති බව තමාට ප්‍රකාශ කරන ලද බවටද කරුණු දක්වා ඇත. තවදුරටත් පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත්තේ නැවත 2024.10.28 වන දින පාර්ශවයන් පොලිසියට කැඳවූ අවස්ථාවේදී අදාළ ගුරුවරිය කිසිවක් නොපැවසූ බවත් එහිදී විදුහල්පතිතුමා දැඩි නොසන්සුන් භාවයකින් හැසිරුණු බවත්, ස්ථානාධිපතිතුමා ගුරුවරියගෙන් ඇසූ ප්‍රශ්නවලට ගුරුවරියට පෙර විදුහල්පතිතුමා විසින් පිළිතුරු ලබා දෙනු දක්නට ලැබුණු බවටත්ය. තවද තමන් විසින් පාසලට ලබාදුන් වෛද්‍ය වාර්තා එදින විදුහල්පතිතුමා රැගෙනවිත් තිබූ බවත් තමා ලබාදුන් ලිඛිත ප්‍රකාශය රැගෙනවිත් නොතිබූ බවත්ය. තමා විසින් දරුවාගේ ගැටලුව පිළිබඳ විදුහල්පතිතුමා දැනුවත් නොකල බව විදුහල්පතිතුමා විසින් පවසනවා නම් දරුවාගේ වෛද්‍ය වාර්තා පාසලට ලැබුණේ කෙසේදැයි තමා විමසූ අවස්ථාවේ විදුහල්පතිතුමා දැඩි ආවේගශිලිව තමාට පහර දෙන්නට මෙන් සැරසුණු බවටත් පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත. එම අවස්ථාවේ ස්ථානාධිපතිතුමා විසින් පසු දින උදෑසන පාසලට ගොස් දරුවාගේ අස්වීම ලබා ගන්නා ලෙස තමාහට ප්‍රකාශ කළ බවත් එහිදී **'අස්වීම දෙන්නේ මේකා මානසික රෝගියෙක් කියලා කාර්ය සාධනයේ ලියල තමයි. ඒක ඉතින් මේකගේ ජීවිතේ කාලෙටම බලපායි'** යනුවෙන් විදුහල්පතිතුමා විසින් ආවේගශීලිව ප්‍රකාශ කර සිටි බවටත් කරුණු දක්වා ඇත. එම අවස්ථාවේ එලෙස අස්වීමක් ලබා ගැනීමට තම දරුවා කළ වරද කුමක්ද යන්නත් තමා පාසලට භාර දුන්නේ නිරෝගී දරුවෙකු මිස මානසික රෝගියෙක් නොවන බවටත්, දරුවා මානසික රෝගියෙකු වූයේ දෙමාපියන්ගේ වරදින් නොවන බවටත් තම බිරිඳ විසින් පවසා සිටි බවට පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.

ඉන්පසු තමා විසින් 2024.10.29 වන දින සහකාර පොලිස් අධිකාරි කාර්යාලයට ගොස් තම ගැටලුව ඉදිරිපත් කළ බවත් එහිදී දරුවාට විශාල අසාධාරණයක් සිදු වී ඇති හෙයින් පසු දින නැවත ගොස් සිරිපුර පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දමන ලෙසට උපදෙස් ලැබුණු බවටත් කරුණු දක්වා ඇත. ඒ පිළිබඳ සිරිපුර පොලිස් ස්ථානය වෙත 2024.10.30 වන දින ගිය බවත් එහිදී ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීතුමියක් පැමිණ දරුවාගේ අධිකරණ වෛද්‍ය වාර්තාවක් ලබා ගත යුතු බැවින් එදිනම රෝහලේ නතර වෙන ලෙසට උපදෙස් දුන් බවද කියා සිටී. ඒ අනුව බිරිඳ සහ දරුවා කිලෝමීටර් 60ක දුරින් පිහිටි පොළොන්නරුව මහ රෝහලට රාත්‍රී 8.30ට පමණ ඇතුළු වූ බවත් දින 06ක කාලයක් දරුවා රෝහල්ගතව ප්‍රතිකාර ලැබූ බවත් වෛද්‍යවරුන් විසින් දරුවාගේ ගැටලුව පිළිබඳ අදාළ රාජ්‍ය ආයතන සියල්ල දැනුවත් කළ බවට තමාට පැවසූ බවත් ඒ අනුව 2024.12.20 වන දින රෝහලෙන් පැවැත්වෙන ගැටලු විසඳීමේ හමුවට පැමිණෙන ලෙස තමාට උපදෙස් ලැබුණු බවටත් පැමිණිල්ලෙන් කරුණු දක්වා

ඇත. තවද දරුවාගේ මෙම ගැටලුව පිළිබඳ තමා විසින් අවස්ථා දෙකකදී (2024.11.10 වන දින හා2025.01.10 වන දින) ජනාධිපති ලේකම් කාර්යාලයට සිදු කළ පැමිණිලි පරිදි උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එය පරීක්ෂණ කටයුතු සඳහා යොමු කර ඇති බවට තමාට දැනගන්නට ලැබුණ නමුත් පැමිණිල්ල ඉදිරිපත් කරන දින වනතුරුත් කිසිදු ආයතනයකින් ඒ පිළිබඳව පරීක්ෂණ කටයුතු පවත්වා නොමැති බවට පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.
නැවතත් තමා විසින් 2024.12.20 දින තම දරුවාගේ ගැටලුව සඳහන් ලිපියක්ද සමඟ තමාට සිදුවන අසාධාරණකම් පිළිබඳ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ගොස් දැනුවත් කළද හිටපු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් ඒ පිළිබඳ සුභවාදී පිළිතුරක් නොලැබුණු බවටද පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.
තවද තම අනිත් දරුවන් දෙදෙනා පො/දිඹු සිරිපුර මධ්‍ය මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන හෙයින් වින්දිත දරුවාද එම පාසලට ඇතුළත් කර ගන්නා ලෙස ඉල්ලීමට තමා සිරිපුර විද්‍යාලයේ විදුහල්පතිතුමා හමුවීමට ගිය බවත් එහිදී අදාල පන්තියේ දරුවන් 50ක් සිටින බැවින් දරුවා ඇතුලත් කළ නොහැකි බව පැවසූ බවත් දරුවාගේ මානසික ගැටලුවක් තිබෙන බැවින් ඉහල නිලධාරියෙකුගේ ලිපියක් පවතීනම් දරුවා ඇතුළත් කර ගැනීමට හැකියාව පවතින බව විදුහල්පතිතුමා විසින් තමාට ප්‍රකාශ කළ බවටත් කරුණු දක්වා ඇත. ඒ අනුව තමා විසින් 2025.01.09 වන දින කලාප අධ්‍යක්ෂතුමා හමුවී ඒ සඳහා අනුමැතිය ඉල්ලා සිටි නමුත් එතුමා විසින් එය ප්‍රතික්ෂේප කරන ලද බව පැමිණිල්ලෙන් වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

මේ ආකාරයට වගකිවයුතු රාජ්‍ය ආයතන වලින් තමාට අසාධාරණකම් සිදුවන බැවින් හා ඒ තුළ දිගින් දිගටම දරුවගේ පාසල් අධ්‍යාපනය අඩාල වීම දරාගත නොහැකි පීඩනයක් බැවින් අවසානයේ තමා නැවතත් පො/දිඹු සිරිපුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා හමුවට ගිය බවත් එහිදීද විදුහල්පතිතුමා විසින් දරුවා ඇතුලත් කර ගැනීම ප්‍රතික්ෂේප කළ බවට පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත. එබැවින් තමා පො/නුවරගල මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා හමුවී දරුවා පිළිබඳ දැනුවත් කල විට එතුමා විසින් දරුවා පාසලට ඇතුලත් කර ගැනීමට කැමත්ත ප්‍රකාශ කළ බවත් ඒ අනුව 2025.04.08 වන දින මාස 08කට පසු තම දරුවාට පාසල් යාමට අවස්ථාව ලැබුණු බවත් පැමිණිලිකරු විසින් කරුණු දක්වා තිබේ.
මෙකී සියලු කරුණු අනුව තමාට හා තම දරුවා හට පො/දිඹු සුගලාදේවි විද්‍යාලයේ බලධාරීන්ගෙන් හා වගකිවයුතු රාජ්‍ය ආයතන වලින් සිදු වූ අසාධාරණ සිදුවීම් සම්බන්ධයෙන් අවධානය යොමු කර පරීක්ෂණයක් සිදු කොට සාධාරණයක් ඉටු කර දෙන මෙන් පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම**

අධ්‍යාපනය ලබමින් සිටි වයස අවුරුදු 8ක දරුවෙකුගේ අධ්‍යාපනය ලැබීමේ අයිතියට එරෙහිව ක්‍රියා කිරීමක් හා පාසල තුළ එම දරුවා පත්ව ඇති කායික හා මානසික හිංසනයන් පිළිබඳව පැමිණිල්ලෙන් කරුණු ඉදිරිපත් වීම මත මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිද්ධිය සම්බන්ධව කඩිනමින් මැදිහත් වන ලදී. ඒ අනුව අදාළ පාර්ශවයන් කැඳවා කඩිනම් පරීක්ෂනයක් සිදු කර ප්‍රකාශ ලබා ගන්නා ලද අතර වගඋත්තරකරුවන්ගෙන් ලිඛිත කරුණු පසුව ලබා ගන්නා ලදී.

**1වන වගඋත්තරකරු පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති එච්.චන්ද්‍රලාල් රාජපක්ෂ මහතා**

උක්ත පැමිණිල්ලේ පළමු වගඋත්තරකරු වන පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති එච්.චන්ද්‍රලාල් රාජපක්ෂ යන අය විසින් 2025.07.01 දින මෙම කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ අවස්ථාවේදී හා 2025.07.05 දිනැති වාර්තාව මඟින් පැමිණිල්ලට අදාළව පහත පරිදි කරුණු දක්වා ඇත.

තමා 2024.02.16 වන දින සිට පො/දිඹු/සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති ලෙස සේවයේ යෙදී සිටින බවත් ඒ අනුව 2024.08.28 වන දින පාසල් පැමිණවීමේ කමිටුව රැස්වී ඇති බවත් එහිදී 03 ශ්‍රේණිය පංතිභාර ගුරුවරිය වන ශිවන්ති පෙරේරා මිය විසින් පැමිණිල්ලේ වින්දිත දරුවා වන ආර්.එම්.මෙනුක අයෝධ්‍යා ශිෂ්‍යාගේ පැමිණීමේ දුර්වලතාව පිළිබඳ තමාව දැනුවත් කරන ලද බවයි. ඒ අනුව 2024.08.14 වන දින සිට 16 වන දින දක්වා දින තුනක්ද ඉන්පසු 2024.08.19 වන දින සිට 2024.08.23 දක්වා නිවාඩු කාලයද නැවත 2024.08.26 දින සිට 2024.08.30 දක්වා දින පහක් දරුවා එක දිගට පාසලට පැමිණ නැති බව නිරීක්ෂණය වී ඇති බවයි. මේ අනුව පංතිභාර ගුරුවරිය දැනුවත් නොකර 2024.08.28 දින වන විට වින්දිත සිසුවාගේ අඛණ්ඩව පාසල් පැවති දින නොපැමිණීම දින 06ක් වූ බවයි. 2024.08.28 දින පවත්වන ලද පාසල් පැමිණවීමේ කමිටු රැස්වීම අනුව 2024.09.02 වන දින වින්දිත දරුවාගේ භාරකරු වන මව පාසලට කැඳවා තොරතුරු විමසා කමිටුවේ සාකච්ඡා කර ඇති බවට ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. තවද 2024.08.28 පංතිභාර ගුරුතුමිය විසින් උපදේශන ගුරුවරිය දැනුවත් කර වින්දිත සිසුවාගේ මව පාසලට පැමිණ පසු උපදේශන ගුරුවරිය හමුවන ලෙස දන්වා ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2024.09.02 දින දරුවාගේ මව හෙවත් භාරකරු විදුහල්පති හමු වීමට පැමිණ ඇති බවත් පංතිභාර ගුරුවරිය හා උපදේශන භාර ගුරුවරිය හමුවන ලෙස මවට උපදෙස් ලබා දී තිබූ නමුත් මව විසින් පංතිභාර ගුරුවරිය හා උපදේශන ගුරුවරිය හමුවී නොමැති බවටත් පළමු වගඋත්තරකරු විසින් කරුණු දක්වා ඇත.

ඉන්පසු 2024.09.24 දින වින්දිත සිසුවාගේ වැඩිමහල් සොයුරිය වන 5 ශ්‍රේණියේ ආර්.එම්. අමදි සිසුවිය මඟින් මවට හෝ පියාට පැමිණ පංතිභාර ගුරුවරිය හමුවන ලෙස වින්දිත සිසුවාගේ පංතිභාර ගුරුවරිය විසින් වාචිකව දැනුවත් කර ඇති බවට එම ගුරුතුමිය විසින් තමා වෙත වාර්තා කරන ලද බවයි. තවද 2024.09.25 දින 3 ශ්‍රේණියේ දෙමාපිය ශ්‍රමදානය සඳහා සහභාගී වීමට විදුහල්පතිතුමාගේ අත්සනින්

ලියුකුව ලිපියක් මගින් දන්වා තිබූ නමුත් ඒ සඳහාද වින්දිත සිසුවාගේ දෙමාපියන් පැමිණ නැති බවයි. තවද පංතියේ වට්ස්ඇප් සමූහය මගින්ද පංතිභාර ගුරුවරිය විසින් වින්දිත දරුවාගේ දෙමාපියන්ව දැනුවත් කර ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇත.

1963/30 චක්‍රලේඛනය අනුව දීර්ඝ කාලීනව පාසල් නොපැමිණෙන හා ගිලිහෙන දරුවන් පිලිබඳ මාසික වාර්තාව 2024.09.30 වන දිනට අදාලව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට භාරදී තිබෙන බවත් එහි ආර්.එම්.මෙනුක අයෝධ්‍යා හෙවත් වින්දිත සිදුවාගේ නම ඇතුළත්ව ඇති බවට ලේඛන පළමු වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. තවද 2024.10.04 වන දින ආර්.එම්.මෙනුක අයෝධ්‍යා ශිෂ්‍යාගේ පියා දරුවා පාසලින් ඉවත් කර ගැනීමට පාසලට පැමිණ ඉල්ලීම් කර තිබූ බවත් දරුවාගේ භාරකරු පියා නොවන බැවින් අස්වීම් ලබා දී නොමැති බවත් එහිදී දරුවාගේ දීර්ඝ කාලීන නොපැමිණීම පිළිබඳ අවධානය යොමු කරන ලෙසත් සිදුවන අධ්‍යාපන අතපසු වීම් පිළිබඳවත් පියාට උපදෙස් ලබා දී ඇති බවටත් කරුණු දක්වා ඇත. තවද දරුවාට අවශ්‍ය උපදේශනය ලබාදීම සඳහා දරුවා පාසලට කැඳවාගෙන එන ලෙස දෙමාපියන් දැනුවත් කර ඇති බවට ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශයේ 2023.12.29 දින නිකුත් කර ඇති 53/2023 චක්‍ර ලේඛයේ 2.3.8.1. ට අනුව ශිෂ්‍යා පාසලට ඇතුළත් කරන ලද මව/පියා හෝ නිත්‍යානුකූල භාරකරුගේ ඉල්ලීම මත ශිෂ්‍ය කාර්යය දර්ශනය නිකුත් කළ හැකි යයි සඳහන් වන බවත් ඒ අනුව මෙම දරුවාගේ භාරකරු වන්නේ මව වන ඩී. එම්. දිල්රුක්ෂි දිසානායක මිය වන බවටත් පළමු වගඋත්තරකරු විසින් කියා සිටී.

2024.10.04 දින පාසලේ විනය කමිටු රැස්වීමක් පවත්වා ඇති බවත් එහිදී ද 03 ශ්‍රේණියේ ආර්. එම්.මෙනුක අයෝධ්‍යා සිසුවාගේ නොපැමිණීම හා අනෙකුත් පංතිවල එවැනි දරුවන් සිටීදැයි සොයා බලන ලෙස උපදෙස් දී තිබෙන බවටත් කරුණු ඉදිරිපත් කර ඇත. 2024.10.10 පාසල් පැමිණීමේ කමිටුව රැස්වීමක් පවත්වා ඇති බවත් ආර්.එම්.මෙනුක අයෝධ්‍යා සිසුවාගේ දීර්ඝකාලීන පාසල් නොපැමිණීම පිළිබඳ එහිදී දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇති බවත් දරුවාගේ අධ්‍යාපන අතපසුවීම් දිගින් දිගටම සිදුවන බවත් අවශ්‍ය උපදේශන ක්‍රියාවලියට දෙමාපියන් දැනුවත් කළ ද සහයෝගයක් නොමැති බැවින් ලිඛිතව දෙමාපියන් දැනුවත් කිරීමට එහිදී තීරණය කරන ලද බවටත් පළමු වගඋත්තරකරු විසින් කරුණු දක්වා ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2023.12.29 දින නිකුත් කර ඇති 53/2023 චක්‍ර ලේඛයේ 2.2.16 වගන්තියට අනුව පාසල පැවැත්වෙන දින 20 ක් අඛණ්ඩව නොපැමිණෙන ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක පිළිබඳ විදුහල්පතිට වාර්තා කිරීම පංතිභාර ගුරුවරයාගේ වගකීම වන බවත් විදුහල්පති විසින් දෙමාපියන්ගෙන් ශිෂ්‍යා නොපැමිණීමට හේතු ලිපියක් මගින් විමසිය යුතු බවටත් කරුණු දක්වා ඇත. මෙදින වන විට මෙම වින්දිත දරුවා පාසල පැවැත් වූ දින 34ක් අඛණ්ඩව පාසල් පැමිණ නොමැති බව මාසික දීර්ඝකාලීන

නොපැමිණීම වාර්තා මගින් කලාප කාර්යාලය වෙත දැනුවත් කරන ලද බවටත් ලේඛන ඉදිරිපත් කර ඇත.

ඒ අනුව 2024.10.11 ආර්.එම්.මෙනුක අයෝධ්‍යා සිසුවාගේ භාරකාරිත්වයට දරුවා පාසල් නොපැමිණි දින ගණන සටහන් කර නොපැමිණීමට හේතු සම්බන්ධයෙන් මේ වන තෙක් පංතිභාර ගුරුවරිය දැනුවත් කර නොමැති බවටත්, ඉගෙනුම් ඉඩ ප්‍රස්ථා දරුවාට අහිමි නොකරන ලෙසත් දරුවා පාසලට හැකි ඉක්මනින් එවීමට කටයුතු කරන ලෙසත් දන්වමින් පංතිභාර ගුරුවරිය විසින් විදුහල්පතිගේ අත්සනින් දෙමාපියන්ට තැපැල් මගින් ලිපියක් යවන ලද බවටත් පළමු වගඋත්තරකරු විසින් කරුණු දක්වා ඇත. 1963/30 චක්‍රලේඛනය අනුව දීර්ඝ කාලීනව පාසල් නොපැමිණෙන හා ගිලිහෙන දරුවන් පිළිබඳ මාසික වාර්තාව 2024.09.30 වන දිනට අදාලව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට භාරදී තිබෙන බවත් ඊට අමතරව මෙම ලිපියේ පිටපත් අනිවාර්ය අධ්‍යාපන නියෝග චක්‍රලේඛනය අනුව අධීක්ෂණ කමිටුවේ සාමාජිකයන් වන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ, ග්‍රාම නිළධාරී, පරිවාස හා ළමාරක්ෂණ නිලධාරි හා පොලිසිය වෙත දැනගැනීම සඳහා 2024.10.11 දින යොමු කර ඇති බවටත් කරුණු දක්වා ඇත.

2024.10.14 දින දරුවාගේ මව වන ඩී. එම්. දිල්රුක්ෂි මිය ආර්. එම්.මේනුක අයෝධ්‍යා දරුවාගේ අස්වීම ලිඛිතව ඉල්ලා ඇති බවත් අස්වීම නිකුත් කිරීමට යොමු කරන ලද ලිපියේ සඳහන් කරුණු ගැටළු සහගත වූ බැවින් හා සිසුවාගේ දීර්ඝකාලීන නොපැමිණීම් සම්බන්ධව මේ වන විට කලාප කාර්යාලය දැනුවත් කර ඇති බැවින් හා විදුහල්පති වශයෙන් තමා කලාප කාර්යාලයෙන් ඒ සම්බන්ධව තවදුරටත් උපදෙස් පැතීමට අවශ්‍ය බැවින් යන හේතු මත පසු දින පැමිණ අස්වීම ලබා ගන්නා ලෙස දරුවාගේ මව දැනුවත් කරන ලද බවටත් පළමු වගඋත්තරකරු විසින් කරුණු දක්වා ඇත. මව දරුවන් සමග පදිංචි සිටින්නේ පාසලේ සිට මීටර් 50ක් පමණ ආසන්න මහවැලි නිළ නිවාසයක වන බවත් තවත් දරුවන් දෙදෙනෙක් පාසලට පැමිණෙන නිසාවෙන් මව නිතර පාසලට පැමිණෙන බැවින් පසු දින අස්වීම ලබා ගන්නා ලෙස දැන්වූ බවත් ඉන්පසු තමා කලාප කාර්යාලයේ දැනුම් දීමකට අනුව හදිසි රාජකාරි කටයුත්තක් සඳහා කලාප කාර්යාලය වෙත පිටත්ව යන ලද බවත් පසු දින මවට අස්වීම ලබා ගැනීමට පැමිණෙන ලෙස දැන්වුවද පැමිණියේ නැති බවටත් පළමු වගඋත්තරකරු විසින් කරුණු දක්වා ඇත.

2024.10.15 වන දින පෙ.ව.8.30 ට රැස් වූ විනය කමිටුවේදී වින්දිත දරුවාගේ මව වන ඩී.එම්.දිල්රුක්ෂි මිය විසින් 03 ශ්‍රේණියේ ගුරුවරිය වන ශිවන්ති පෙරේරා මිය වෙත කර ඇති චෝදනාව පිළිබඳ සාකච්ඡා කරන ලද බවත් ඒ අනුව ගුරු මණ්ඩලය සඳහා අවවාද හා උපදෙස් ලබා දී තිබෙන බවට ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. තවද 2024.10.25 දින 03 ශ්‍රේණියේ පංති රැස්වීම පවත්වා ඇති බවත් එහිදී දීර්ඝ කාලීන නොපැමිණෙන දරුවන් පිළිබඳ සාකච්ඡා කර ඇති බවත් ආර්. එම්. මෙනුක සිසුවාගේ පාසල් නොපැමිණීම පිළිබඳ ගුරුවරිය විසින් සාකච්ඡා කර ඇති බවත් සියළුම දෙමාපියන්ට තම දරුවන් පිළිබඳ පෞද්ගලිකව කතා කිරීමට ගුරුවරිය අවස්ථාව ලබාදී ඇති බවටත් නිළ සටහන් පොතෙහි පිටපත් කොමිෂන් සභාව වෙත පළමු වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇත.

2024/10/28 වන දින 3 ශ්‍රේණියේ ගුරුවරිය හා තමා ප.ව 2.00 ට සිරිපුර පොලිස් ස්ථානයට කැඳවා තිබූ බවත් එයට හේතුව ලෙස පාසල විසින් 2024.10.11 වන දින යොමු කරන ලද වින්දිත දරුවාගේ දීර්ඝකාලීන පාසල් නොපැමිණීම සම්බන්ධව ලිපි පිටපතට අදාලව කරුණු විමසීමට බව ස්ථානාධිපතිතුමා විසින් තමා වෙත දන්වන ලද බවටත් පළමු වගඋත්තරකරු විසින් කරුණු ඉදිරිපත් කර ඇත. එදින වින්දිත දරුවාගේ මව වන ඩී.එම්.දිල්රුක්ෂි මිය පැමිණ තිබූ බවත් දරුවාගේ අස්වීම ගැනීමට එදිනට පසු දින එනම් 2024.10.19 දින පාසලට පැමිණෙන බවට පොලිස් ස්ථානාධිපති ඉදිරියේ ප්‍රකාශ කර සිටි බවත්ය. එහිදී මෙම කරුණ සම්බන්ධව පොලිස් පැමිණිල්ලක් අවශ්‍යදැයි ස්ථානාධිපතිතුමා විසින් මවගෙන් විමසූ විට පැමිණිල්ලක් අවශ්‍ය නොවන බවට ඇය පැවසූ බවයි. නමුත් පසු දින ද දරුවාගේ අස්වීම ලබා ගැනීමට මව නොපැමිණි බවයි. ඒ සම්බන්ධව තමා සිරිපුර පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ පොලිස් පරික්ෂකතුමිය වෙත දැනුවත් කරන ලද බවටත් පළමු වගඋත්තරකරු විසින් කරුණු දක්වා ඇත.

ඉන්පසු 2024.11.03 දීර්ඝකාලීන පාසල් නොපැමිණීම පිළිබඳ 2024 ඔක්තොම්බර් මසට අදාල වාර්තාව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට යොමු කර ඇති බවත් ආර්. එම් මෙනුක අයෝධ්‍යා ශිෂ්‍යාගේ නම එහි සඳහන් වන බවටත් පළමු වගඋත්තරකරු විසින් ලේඛන ඉදිරිපත් කර ඇත.

තවද 2024.11.04 සිරිපුර පොලිස් ස්ථානය විසින් ආර්.එම්.මෙනුක අයෝධ්‍යා සිසුවාගේ මව විසින් ඉදිරිපත් කළ පැමිණිල්ලක් විභාග කිරීම සඳහා පොලිසියට පැමිණෙන ලෙස තමාට දන්වා තිබූ බවත් එදින තමාගේ කටඋත්තර සටහන් කර ගත් බවත් අස්වීම ගැනීම සඳහා මව මෙතෙක් නොපැමිණි බව එහිදී තමා විසින් ප්‍රකාශ කළ බවටත් කරුණු දක්වා ඇත. තවද 2024.11.05 වන දින පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිවාස නිළධාරී පාසලට පැමිණ පංතිභාර ගුරුවරිය, දරුවන් හා අනෙකුත් ගුරුවරුන්ගෙන් සිදුවියට අදාළව ප්‍රකාශ සටහන් කරගෙන ඇති බවට උපදේශක සටහන් පොතෙහි පිටපත් පළමු වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ඉන්පසු 2024.11.11 වන දින පාසල් පැමිණවීමේ කමිටු රැස්වීම පවත්වා ඇති බවත් එහිදී ආර්.එම්.මෙනුක සිසුවාගේ බාල සොයුරා වන ආර්.එම්. සනුක සංජන සිසුවාගේ දීර්ඝකාලීන නොපැමිණීම සම්බන්ධව සාකච්ඡා කර ඇති බවයි. තවද 2024.11.12 උපදේශන කමිටුව රැස්වී ඇති බවත් දීර්ඝකාලීන නොපැමිණීම පිළිබඳව කලාප කාර්යාලය දැනුවත් කළ යුතු බව එහිදී දන්වා ඇති බවටත් කරුණු දක්වා ඇත. තවද 2024.11.18 සිරිපුර පොලිස් ස්ථානයෙ දුරකථනයෙන් ආර්.එම්.මෙනුක අයෝධ්‍යා සිසුවා මව සමග පාසලට පැමිණෙන බවට තමා වෙත දැනුවත් කිරීමක් සිදුකළ නමුත් ඔවුන් නොපැමිණි බවටත් පළමු වගඋත්තරකරු විසින් කරුණු දක්වා ඇත. 2024.11.22 දින දීර්ඝකාලීන පාසල් නොපැමිණීම පිළිබඳ 2024 නොවැම්බර් මසට අදාල වාර්තාව කොට්ඨාශ අධ්‍යාපන

කාර්යාලයට යොමු කරන ලද බවත් ආර්.එම්.මෙනුක සිසුවාගේ බාල සොයුරා වන ආර්.එම්.සනුක සංජන සිසුවාගේ දීර්ඝකාලීන නොපැමිණීම ද එහි සටහන්ව ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇත.

තවද 2025.01.02. සිරිපුර පොලිස් ස්ථානයෙ දුරකථනයෙන් ළමා හා කාන්තා කාර්යංශයේ ස්ථානාධිපතිතුමිය විසින් ස්ථානීය පරීක්ෂණයක් සඳහා පාසලට පැමිණෙන බව තමාට පැවසූ බවත් එදින නිවාඩු දිනයක් වූ බැවින් තමා නියෝජ්‍ය විදුහල්පතිතුමියට හා පාසල් කාර්යාල සහයිකාවකට පාසලට පැමිණෙන ලෙස දැනුවත් කරන ලද බවට කරුණු දක්වා ඇත. 2025.01.07 දින සිරිපුර පොලිස් ස්ථානයෙන් පැමිණ දීර්ඝකාලීන නොපැමිණෙන දරුවන් පිළිබඳ විස්තර රැගෙන ගොස් ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇත.

තවද 2025.01.27 ආර්. එම්. අමන්දි ප්‍රබෝධ්‍යා වන වින්දිත සිසුවාගේ සහෝදරිය 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබා 6 ශ්‍රේණිය සඳහා වෙනත් පාසලකට යාමට අස්වීම ලබා ගෙන ඇති බවත් එහිදී පියා විසින් ශිෂ්‍ය කාර්ය දර්ශනය පැමිණ රැගෙන ගොස් ඇති නමුත් ආර්.එම්.මේනුක අයෝධ්‍යා සිදුවාගේ කාර්ය දර්ශනය ලබාගෙන නැති බවට කරුණු දක්වමින් දරුවන් ඇතුළත් කිරීමේ හා අස් කිරීමේ ලේඛනයේ පිටපත් ඉදිරිපත් කර ඇත.

2025.02.06 ජනවාරි (2025) මාසයට අදාළව දීර්ඝකාලීන නොපැමිණීම් වාර්තාව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය වෙත යොමු කොට ඇති බවත් ආර්.එම්.මෙනුක සිසුවාගේ බාල සොයුරා වන ආර්. එම්. සනුක සංජන සිසුවාගේ දීර්ඝකාලීන නොපැමිණීම් ද සටහන්ව ඇති බව කරුණු දක්වා ඇත. පාසල් නිළ ඇඳුම් භාර ගැනීමට 2025.02.06 පාසලට පැමිණෙන ලෙස 2025.01.22 දැනුවත් කළද දෙමාපියන් නොපැමිණීම නිසා ලියාපදිංචි තැපැල් ලිපි මගින් නිළ ඇඳුම් භාරගන්නා ලෙස දෙමාපියන් දැනුවත් කරන ලද බවට ලේඛන ඉදිරිපත් කර ඇත. තවද 2025.02.19 දින පාසලේ දරුවන් සඳහා පාවහන් වවුචර් හා ලිපිද්‍රව්‍ය වවුචර් ලබා දී ඇති බවත් ඒවා ලබා ගැනීම සඳහා 2025.02.27 වන දින මෙම දරුවන්ගේ මිත්තණිය පැමිණ ලිඛිතව ඉල්ලා සිටි බවත් තමා විසින් දුරකථන ඇමතුමක් මවට ලබා දී නිවැරදිව තහවුරු කර එම වවුචර් භාර දෙන ලද බවටත් කරුණු දක්වා ඇත.

2025 මාර්තු මාසයේදී 2025 පෙබරවාරි මාසයට අදාළව දරුවන්ගේ දීර්ඝකාලීන නොපැමිණීම් පිළිබඳ වාර්තාව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට යොමු කොට ඇති බවත් ආර්.එම්. සනුක සංජන සිසුවාගේ දීර්ඝකාලීන නොපැමිණීම් ද සටහන්ව ඇති බවත් මෙම දරුවා ආර්.එම්. මෙනුක සිසුවාගේ බාල සොයුරා වන බවත්ය. 2025.03.10 වන දින වින්දිත දරුවන්ගේ පියා පැමිණ ආර්.එම්.මෙනුක අයෝධ්‍යා හා ආර්.එම්.එස්,සංජන සත්සරගේ ශිෂ්‍ය කාර්යය දර්ශනය රැගෙන ගොස් ඇති බවට දරුවන් ඇතුළත් කිරීමේ හා අස් කිරීමේ ලේඛනයේ පිටපත් පළමු වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

තම පාසල තුළ දරුවන් සඳහා සුරක්ෂිතව ඉගෙනුම් කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය විදුහල්පති ලෙස තමා ගොඩනගා ඇති බවත් 2024 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් සිදු කරන ලද සමීක්ෂණයකට අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසල් අතරින් ළමා සුරක්ෂිත පාසලක් ලෙස තම පාසල ඇගයීමට ලක්වූ බවටත් ලේඛන ද ඉදිරිපත් කර ඇත.

2024 වර්ෂයේ 03 ශ්‍රේණිය ඉගෙනුම් කටයුතු කළ හා වර්තමානයේ 04 ශ්‍රේණිය ඉගෙනුම් කටයුතු සිදු කරන ශිවන්ති පෙරේරා ගුරුවරිය ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පුහුණුව ලත් දක්ෂ ගුරුවරියක වන බවත් දරුවන්ගේ හා පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම විෂය බාහිර වැඩ කටයුතු ඉතා වගකීමෙන් සිදු කරන ගුරුවරියක් බවත් ඇයගේ මෙතෙක් සේවා කාලය තුළ චෝදනාවක් හෝ විනය විරෝධී කිසිවක් වාර්තාවී නොමැති බව පළමු වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත.

තමා චක්‍රලේඛ නියෝග හා අණපනත් අනුව රාජකාරිය නිසි පරිදි සිදු කරන රාජ්‍ය නිළධාරියෙක් වන බවත් තමා සෑම විටම උත්සහ දැරුවේ වින්දිත දරුවාගේ අභිවෘද්ධිය වෙනුවෙන් පාසල් පැමිණවා ගැනීමට බවටත් කරුණු දක්වා ඇත. වින්දිත දරුවා උපදේශනය සඳහා පාසලට ගෙන්වා ගැනීමට විවිධ අවස්ථාවල මොපියන් දැනුවත් කළද මව හිතා මතා පංතිභාර ගුරුවරිය හා උපදේශනභාර ගුරුවරිය මගහැර ඇති බවත් පාසලෙන් අස්වීම ගැනීමට මව පැමිණ එක් වතාවක් ඉල්ලීම් කරන ලද බවත් පසුව පාසලට කිසිම අවස්ථාවක පැමිණියේ නැති බවටත් කරුණු දක්වා ඇත. දරුවා මානසික පීඩනයකින් සිටින බව ප්‍රකාශ කළ ද එම වෛද්‍ය වාර්තා පාසලට භාර දී තිබුනේ අස්වීම ඉල්ලීමට මව පාසලට පැමිණි දිනයේ බවට පළමු වගඋත්තරකරු විසින් වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

තමා දරුවාට අස්වීම ලබා දීම කිසිම විටක ප්‍රතික්ෂේප කර නොමැති බවත් ඉල්ලීම් ලිපියේද ඉහලින් තමා සටහන් කර ඇත්තේ කාර්යය සාධනය නිකුත් කරන ලෙස බවටත් කරුණු දක්වා ඇත. නමුත් එය ක්‍රියාවලියක් ඔස්සේ සිදුවන දෙයක් බැවින් හා අනිවාර්ය අධ්‍යාපන නියෝග අනුව කලාප කාර්යාලය දැනුවත් කර ඇති බැවින් ඒ පිළිබඳ උපදේශයක් ගැනීම තමාගේ වගකීම බවටත් කරුණු දක්වා ඇත. පාසල අස්වීම ගැනීමට මවට මදක් සිටින ලෙස තමා පැවසුවේ එබැවින් බවට කරුණු දක්වා ඇත. පාසල ආසන්නයේම සිටින මව නිතර පාසල අසලට පැමිණෙනු තමා දැක තිබෙන නමුත් එදිනෙන් පසු කිසිම දිනක අස්වීම ගැනීමට පාසලට නොපැමිණි බවටත් කරුණු දක්වා ඇත.

තමා කිසිම විටක දැනුවත්ව හෝ චේතනාන්විතව අස්වීම දීම ප්‍රතික්ෂේප නොකළ බවත් සෑම විටම එකී දරුවාගේ සුබසෙත වෙනුවෙන් කටයුතු කර ඇති බවත් යම් ලෙසකින් අඩු පාඩුවක් අතපසු වීමක් සිදු වී ඇත්නම් තමා ඒ පිළබඳව කණගාටු වන බවත් මින් ඉදිරියේ දී එවැනි අඩුපාඩු හෝ අතපසු වීමක්වත් නොවන සේ රාජකාරියේ යෙදීමට වගකීමෙන් යුතුව බැඳී සිටින බවටත් පළමුවන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත.

**2වන වගඋත්තරකරු 3 ශ්‍රේණිය පන්තිභාර ගුරුවරිය සෙල්ලප්පෙරුමගේ නිරක්ෂි නිලූෂිකා ශිවන්ති පෙරේරාගේ කරුණු දැක්වීම**

උක්ත පැමිණිල්ලේ දෙවන වගඋත්තරකරු වන පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ වින්දිත දරුවාගේ පන්ති භාර ගුරුවරිය වූ සෙල්ලපෙරුමගේ නිරක්ෂි නිලූෂිකා ශිවන්ති පෙරේරා යන අය විසින් 2025.07.01 දින මෙම කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ අවස්ථාවේදී හා 2025.07.05 දිනැති වාර්තාව මගින් පැමිණිල්ලට අදාළව පහත පරිදි කරුණු දක්වා ඇත.

තමා 2023.06.13 දින පො/දිඹු/ සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ රාජකාරී කටයුතු භාර ගන්නා ලද බවත් 2024 වසරේ තමා හට 3 ශ්‍රේණියේ පංති භාරකාරත්වය ලබාදුන් බවටත් කරුණු දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත්ව සිදුකොට ළමුන්ගේ සාධන මට්ටම ඉහල නැංවීමේදී පාසලේ නීති රීති වලට හා චක්‍රලේඛ වලට අනුකූලව විදුහල්පතිතුමාගේ උපදෙස් අනුව දෙමාපිය සහයෝගය ලබා ගනිමින් 3 ශ්‍රේණියේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සිදු කළ බවටත් කරුණු දක්වා ඇත. එහිදී සෑම දරුවෙකු පිළිබඳවම අවධානය යොමු කරමින් ඉගැන්වීම් කටයුතු සිදු කරන බැවින් පාසල් නොපැමිණෙන දරුවන් පිළිබඳව පන්ති කාමරය තුළ අවධානය යොමු කරමින් ඔවුන් පාසල වෙත අඛණ්ඩව ගෙන්වීම සඳහා කටයුතු සිදු කරන බවත් බවටත් කරුණු දක්වා ඇත. ඒ අනුව 2024 - 3 ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ වින්දිත සිසුවා වන ආර්.එම්.මෙනුක අයෝධ්‍යාගේ පාසල් පැමිණීම 2024.08.13 දිනෙන් නතර වී තිබූ බැවින් 2024.08.28 දින පාසල් පැමිණවීමේ කමිටුවේදී දීර්ඝ කාලීන පාසල් නොපැමිණෙන සිසුන් පිළිබඳව දැනුවත් කිරීමේදී එම සිසුවා 2024.08.28 දින වන විට දින 6 අඛණ්ඩව පාසල් පැමිණ නොමැති බව තමා විසින් දන්වා සිටින ලද බවට දෙවන වගඋත්තරකරු විසින් කරුණු දක්වා ඇත.

තවද 2024.09.18 දින පාසලේ පැවැත්වෙන ශ්‍රමදාන කටයුතු සඳහා වට්ස්ඇප් සමූහය මාර්ගයෙන් වින්දිත දරුවාගේ දෙමාපියන් දැනුවත් කර 2024.09.19 දින පැමිණෙන ලෙස දැන්වුවද පාසලට නොපැමිණීම හේතුවෙන් 2024.09.24 දිනද වට්ස්ඇප් පණිවිඩයක් මගින් හා 2024 - 5ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ මෙනුක අයෝධ්‍යා සිසුවාගේ වැඩිමහල් සහෝදරිය වූ ආර්.එම්.අමන්දි සිසුවිය මගින් 2024.09.25 දින තම මවට හෝ පියාට පැමිණෙන ලෙස පණිවිඩයක් යවන ලද බවට වට්ස්ඇප් උපුටන හා චර්යා සටහන් වාර්තා ඉදිරිපත් කරමින් කරුණු දක්වා ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2023.12.29 දිනැති 53/2023 චක්‍රලේඛයේ 2.2.16 වගන්තියට අනුව 2024.0814 දින සිට 2024.10.11 දින දක්වා දරුවාගේ අඛණ්ඩ නොපැමිණීම් දින 20 ඉක්මවා ගොස් ඇති බැවින් ඒ පිළිබඳ (දින 34) විදුහල්පතිතුමා දැනුවත් කරන ලද බවත් ඒ අනුව 2024.10.11 වන දින විදුහල්පතිතුමා මගින් පාසල් පැමිණීම අනිවාර්ය බව අවධාරණය කිරීම යන මැයෙන් සිරිපුර පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය ඇතුලු රාජ්‍ය ආයතන කිහිපයකට පිටපත් සහිතව වින්දිත දරුවාගේ මව වෙත යොමු කරන ලද ලිපියට අදාළව කරුණු විභාග කිරීම සඳහා 2024.10.28 වන දින සවස විදුහල්පතිතුමා සමග සිරිපුර පොලිස් ස්ථානයට යන ලද බවයි. එහිදී, ආර්.එම්.මෙනුක අයෝධ්‍යා

සිසුවා සහ ඔහුගේ මව වන ඩී.එම්.දිල්රුක්ෂි දිසානායක හා පියා ආර්.එම්.මහින්දපාල යන අය සමඟ පොලිස් ස්ථානාධිපතිතුමා ඉදිරියේ පැමිණිල්ලට අදාළව කරුණු සාකච්ඡා කරන ලද බවයි. එහිදී මෙනුක අයෝධ්‍යා සිසුවාගේ මව දරුවා තුන ශ්‍රේණි පන්ති කාමරයේ තවදුරටත් ඉගෙනුම් කටයුතු සිදු කිරීමට අකමැති බවත් දරුවා යම් මානසික පීඩනයකින් පෙළෙන බැවින් පාසලෙන් අස් කර ගත යුතු බව පවසා සිටි බවත් ඒ අනුව ඊට පසු දින එනම් 2024.10.29 වන දින පාසලට ගොස් දරුවාගේ අස්වීම ලබා ගන්නා ලෙස ස්ථානාධිපතිතුමා විසින් දරුවාගේ මවට දැනුම් දුන් බවටත් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත.

තවද 2024.10.11 වන දින යොමු කළ ලිපියට අදාළව 2024.11.05 දින පරිවාස නිලධාරීතුමිය පාසලට පැමිණ කාර්යාලයේදී මේ පිළිබඳව තමාගෙන් ප්‍රකාශ සටහන් කරගන්නා ලද බවත් එසේම 3 ශ්‍රේණියේ අහඹු ලෙස තෝරාගත් දරුවන් කිහිප දෙනෙකු, දෙමාපියන් කිහිපදෙනෙකු හා පාසලේ අනෙකුත් ගුරුභවතුන්ගේද ප්‍රකාශ සටහන් කරගන්නා ලද බවටත් ප්‍රකාශ කරමින් උපදේශන සටහන්හි පිටපත් ඉදිරිපත් කර ඇත. පසුව 2024.11.05 වන දින වින්දිත දරුවාගේ මව වන දිල්රුක්ෂි දිසානායක අය විසින් සිරිපුර පොලිස් ස්ථානයේ දැමූ පැමිණිල්ලක් විභාග කිරීම සඳහා ඩබ්.ජී. කයාලි ෂෙනායා, නිසඳ නිම්සර සමරවීර,ඩබ්.ජී. තීක්ෂණ රන්සිළු, එම්.පී. නිසිඳු නෙතුම්, එම්.පී ඉනුක යේමිත යන සිසුන් තම දෙමාපියන් සමග ප්‍රකාශ ලබාදීමට සිරිපුර පොලිස් ස්ථානයට කැඳවන ලද බවට හා පො/ දිඹු/ සුගලා දේවි ප්‍රාථමික විද්‍යාලයේ උපදේශන හා මාර්ගෝපදේශන භාර ගුරු වන එච්.එම්.ඒ.එම්.ජයතිලක මහත්මිය ද ප්‍රකාශ සටහන් කිරීමට සිරිපුර පොලිස් ස්ථානයට කැඳවන ලද බවට පාසල් පැමිණවීමේ කමිටු වාර්තාවේ පිටපත් ඉදිරිපත් කරමින් කරුණු දක්වා ඇත.

වින්දිත දරුවාගේ මව වන ඩී.එම්.දිල්රුක්ෂි දිසානායක යන අය විසින් සිරිපුර පොලිස් ස්ථානයේ දැමූ පැමිණිල්ලක් විභාග කිරීම සඳහා 2024.12.16 වන දින උදෑසන 10.00 පමණ සිරිපුර පොලිස් ස්ථානයට තමා කැඳවා තිබූ බවත් ඉන්පසු 2025.01.02 වන දින සිරිපුර පොලිස් ස්ථානය මගින් පො/දිඹු සුගලාදේවි ප්‍රාථමික විද්‍යාලයේ සිදුවීමට අදාළව ස්ථානීය පරීක්ෂණය සිදු කරන ලද බවටත් කරුණු දක්වා ඇත.

ආර්.එම්.මෙනුක අයෝධ්‍යා සිසුවාගේ මව හා පියා විසින් පවසා ඇති පරිදි පො/දිඹු සුගලාදේවි ප්‍රාථමික විද්‍යාලයේ 2024 - 3 ශ්‍රේණියේ පන්තිභාර ගුරුවරිය වූ තමා විසින් ඔවුන්ගේ දරුවාට විවිධ කායික හා මානසික පීඩාවන්ට පත් කර ඇති බවට චෝදනා කර ඇති නමුත් මෙනුක අයෝධ්‍යා සිසුවා 2024.02.19 වන දින සිට 2024.08.13 වන දින දක්වා තමා සමග පන්ති කාමරයේ හොඳින් අධ්‍යාපන කටයුතු සිදු කළ දරුවෙකු බවත් අනෙක් සිසුන්ට සාපේක්ෂව තමාගේ අධ්‍යයන කටයුතු සිදු කරමින් පන්ති කාමරය තුළ සාමකාමීව අනෙක් දරුවන් සමඟ රණ්ඩු සරුවල් ඇති කර නොගනිමින් තම අධ්‍යාපන කටයුතු සිදු කළ

දරුවෙකු බවයි. මෙම දරුවාගේ ඉගෙනුම් කටයුතු ද දුර්වල මට්ටමක නොපැවති බවත් ඒ බව තක්සේරු වාර්තා අත්‍යවශ්‍ය නිපුණතා වාර්තා වලින් මැනවින් වටහා ගත හැකි බවටත් කරුණු දක්වා ඇත.

තවද මෙම දරුවා 2024.02.19 දින 3 ශ්‍රේණිය ආරම්භයේ සිට 2024.08.13 වන දින තෙක් දින 97 කට ආසන්න කාලයක් තමා සමඟ පන්ති කාමරයේ ඉගෙනුම් කටයුතු සිදු කර ඇති බවත් ඉන් ද මෙම දරුවා පාසැල් පැමිණ ඇත්තේ දින 81 පමණ බවටත් කරුණු දක්වා ඇත. එම කාල සීමාව තුළ මෙම දරුවා කිසියම් මානසික පීඩාවකින් හෝ රෝගී තත්වයකින් පෙළෙන බවට වූ කිසිදු හැසිරීමක් දරුවා තුළින් නොදුටු බවට කරුණු දක්වා ඇත. එසේම පළමු වාර විභාගයේ ලකුණු විශ්ලේෂණය කළ විට දරුවා විෂයන් 6 ටම ලබාගත් ලකුණු වල යහපත් සාධනීය මට්ටමක් බැවින් දරුවාට මතකයේ අඩුවක් හෝ ඉගෙනීමට දුර්වල බවක් මින් පැහැදිලි නොවන බවටත් කරුණු දක්වා ඇත. පන්ති කාමරය තුළදී සෑම දරුවෙකුටම සම අවස්ථා ලබා දුන් බවත් පාසලේ උදෑසන රැස්වීම් වලදී විවිධ විශේෂාංග ඉදිරිපත් කිරීමට මෙනුක අයෝධ්‍යා සිසුවා අවස්ථාව උදාකර ගත් බවත් එම ඉදිරිපත් කිරීම් ඉතාම සාර්ථක ලෙස කිරීමට මෙම දරුවාට හැකි වූ බවටත් කරුණු දක්වමින් උදෑසන රැස්වීම වැඩ බෙදා දීමේ ලේඛනයේ පිටපත් ඉදිරිපත් කර ඇත. දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ මසකට වරක් හෝ මාස දෙකකට වරක් දෙමාපියන් කැඳවා ප්‍රගති සමාලෝචන සිදු කරන බැවින් එවන් අවස්ථාවල සියලුම දරුවන්ගේ ප්‍රගති සාධන මට්ටම පිළිබඳව පෞද්ගලිකව දෙමාපියන් දැනුවත් කිරීම සිදුකරන බවත් එහිදී දරුවා සම්බන්ධ ඕනෑම කරුණක් ඉදිරිපත් කිරීමට දෙමාපියන්ට අවස්ථාව ලබා දී ඇති බවට කරුණු දක්වමින් පන්ති කව වාර්තාහි පිටපත් ඉදිරිපත් කර ඇත.

දරුවන් 25 දෙනෙකුගෙන් යුත් පන්ති කාමරයේ කිසිදු දරුවෙකුට කිසිදු අසාධාරණයක් සිදු නොවන අයුරින් අධ්‍යාපන කටයුතු සිදු කරන බවටත් ඕනෑම අවස්ථාවක දෙමාපියන්ට පැමිණ හෝ පන්තිභාර ගුරුභවතා වන තමා දුරකථනයෙන් හෝ අමතා තම ගැටලු ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දී තිබූ නමුත් මෙනුක අයෝධ්‍යා සිසුවාගේ මව හෝ පියා 2024.10.28 සිරිපුර පොලිස් ස්ථානයේදී කරුණු ඉදිරිපත් කරන තුරු තමා හමු වී තම දරුවාට පවතින ගැටලුකාරී තත්ත්වය පිළිබඳව කිසිදු දිනෙක සාකච්ඡා කර නොමැති බවටත් දෙවන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත. වයස අවුරුදු 8ක පමණ වන කුඩා දරුවන් සමඟ ආදරයෙන්, කරුණාවෙන් හා මිත්‍රශීලී ලෙස අධ්‍යාපන කටයුතු කරගෙන ගිය බවත් එබැවින් පන්තිභාර ගුරුතුමිය වන තමාගේ ක්‍රියාකලාපය හේතුවෙන් මෙනුක අයෝධ්‍යා සිසුවා මානසික පීඩනයකට ලක්වීමට තමා හේතුවක් වූ බව නොපිළිගන්නා බවට දෙවන වගඋත්තරකාරිය විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත.

තවද තමා කිසිදු දිනක පන්ති කාමරය තුළ කෝටුවක්/වේවැලක් තබාගෙන නොමැති බවත් එබැවින් කිසිදු දිනක දරුවෙකුට පහරක් ගසා දඬුවම් කර නොමැති බවත්, එබැවින් මෙනුක අයෝධ්‍යා සිසුවාගේ මව හා පියා කරන චෝදනා පිළිබඳව තමා හට ඇත්තේ බලවත් කණගාටුවක් බවටත් එබැවින් එම දරුවාගේ මානසික පීඩනයට හේතුව පාසලේ පන්ති කාමරයේ ගැටලුවක්ද තම නිවසේ හෝ ඇති වූ

දරුවන්ගේ උක්ත ප්‍රකාශ අනුව පැමිණිල්ලේ දෙවන වගඋත්තරකාර ගුරුවරිය පාසල තුළ දරුවන්ට කෝටුවකින් හා අතින් පහර දී ඇති බවට කරුණු අනාවරණය වේ. වින්දිත දරුවාටද පහර දී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව 3 ශ්‍රේණිය පන්තිභාර ගුරුවරිය දරුවන් සම්බන්ධයෙන් කටයුතු කර ඇති ආකාරය නීතියට පටහැනි බවත් එය පාසල් ගුරුවරියකට උචිත නොවන ක්‍රියාකලාපයක් බවත් නිරීක්ෂණය වේ.

නමුත් දෙවන වගඋත්තරකාර 3 ශ්‍රේණිය පන්තිභාර ගුරුවරිය වූ සෙල්ලප්පෙරුමගේ නිරක්ෂි නිලූෂිකා ශිවන්ති පෙරේරා යන අය විසින් සිද්ධියට අදාළව මනම්පිටිය කලාප අධ්‍යාප අධ්‍යක්ෂ අමතා ඇති ලිඛිත ප්‍රකාශයේ 8වන පිටුවෙහි දක්වා ඇත්තේ තමා කිසිදු දිනක පන්ති කාමරය තුළ කෝටුවක් හෝ වේවැලක් තබාගෙන නොමැති බවත් එබැවින් කිසිදු දිනෙක පහරක් ගසා දඬුවම් කර නොමැති බවත් එබැවින් වින්දිත දරුවාගේ මව හා පියා විසින් කරන චෝදනා පිළිබඳ කණගාටු වන බවටත්ය. එසේම මෙම කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ අවස්ථාවේදී හා 2025.07.05 දිනැති වාර්තාව මඟින් තමා කිසිදු දිනක පන්ති කාමරය තුළ කෝටුවක්/වේවැලක් තබාගෙන නොමැති බවත් එබැවින් කිසිදු දිනක දරුවෙකුට පහරක් ගසා දඬුවම් කර නොමැති බවටත්ය. නමුත් උක්ත දරුවන්ගේ ප්‍රකාශ අනුව ගුරුවරියගේ එකී කරුණු දැක්වීම් සාවද්‍ය කරුණු දැක්වීම් වන බවට කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

- තවද පාසලේ දරුවන්ගේ මෙම ප්‍රකාශ අනුව අදාළ ගුරුවරිය විසින් යම් යම් අවස්ථාවලදී වින්දිත දරුවාට අතින් සහ කෝටුවකින් පහර දී ඇති බව පෙනෙන්ට තිබියදී සිද්ධියට අදාළව මනම්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සිදු කරන ලද විමර්ශණයේ නිරීක්ෂණ හා නිර්දේශ අනුව දක්වා ඇත්තේ දරුවාට හානියක් කිරීමේ චේතනාවෙන් නොව දරුවන් යහමගට ගැනීමේ චේතනාවෙන් යම් යම් අවස්ථාවල ගුරුවරිය විසින් දඬුවම් කර ඇති බව නිරීක්ෂණය වන බවත් එම දඬුවම බරපතල නොවන බව ද නිරීක්ෂණය වන බවටය. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති 12/2016 චක්‍රලේඛනය ප්‍රකාරව පාසල් තුළ ශාරීරික දණ්ඩණය තහනම් කර ඇති පසුබිමක බලධාරී ආයතනක් විසින් ශාරික දණ්ඩණය සාධාරණීකරණය කරමින් එවැනි ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අතිශය ගැටලු සහගත බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

- පාසලේ පන්ති භාර ගුරුතුමිය වෙතින් සිදු වූ කායික හා මානසික හිංසනයට ලක්වීම යන සමස්ථ සිදුවීම් හමුවේ වින්දිත දරුවා මානසික බලපෑමකට ගොදුරු වී මානසික වෛද්‍ය ප්‍රතිකාර වෙත යොමු කර ඉක්බිතිව ප්‍රතිකාර සඳහා මානසික වෛද්‍ය සායන සඳහා ගොස් ඇති බවට පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති වෛද්‍ය වාර්තා හා ලේඛන අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව වින්දිත දරුවා වන ආර්.එම්. මෙනුක අයෝධ්‍ය වින්දිත දරුවාට අදාළව පොලොන්නරුව ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් නිකුත් කර ඇති 2024.10.30 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවා ඇත. එම අධිකරණ වාර්තාවෙහි රෝගියා

විසින් ලබා දෙන ලද කෙටි රෝග ඉතිහාසය යන්නෙහි " **පන්තියේ ශිවන්ති ටීචර් මට ගහනවා. ගොඩක් කල් ඉඳලා ගහනවා. ටීචර් අතින් කොන්දටයි පස්සටයි ගොඩක් සැරයක් ගහලා තියනවා. පුස්තකාලයට එක්කරගෙන ගිහිල්ලා කොස්සෙන් පස්සට ගහනවා. ගොඩක් සැරයක් එහෙම වෙලා තියනවා** " යනුවෙන් ප්‍රකාශ කොට ඇත. තවද එම අධිකරණ වාර්තාවෙහි දරුවාගේ මව විසින් ලබා දී ඇති කෙටි රෝග ඉතිහාසය අනුව දරුවා විසින් සිදු කරගන්නා කොනිත්තා ගැනීම් (Self–pinching) සම්බන්ධව විස්තර කොට ඇත. මෙකී තොරතුරු අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් වින්දිත දරුවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව පහත සඳහන් රෝග නිරීක්ෂණ සටහන් කර තිබේ.

1) මෑත කාලීන සීරීම් - දකුණු අතේ පිටත පැත්තේ 1.5 සෙ.මී. x 0.2 සෙ.මී.
2) මෑත කාලීන සීරීම් - දකුණු අතේ පිටුපස 0.2 සෙ.මී. x 0.2 සෙ.මී
3) මෑත කාලීන සීරීම් - වම් අතේ පිටත පැත්තේ 0.5 සෙ.මී. x 0.5 සෙ.මී. ද තුවාල හඳුනාගෙන ඇත.

ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවරයා දරණ මතය වන්නේ අංක 1,2,3 මඟින් දක්වා ඇති තුවාල ස්වභාවය මොට බලයක් යෙදීම හේතුවෙන් සිදු වී ඇති බවයි. තවද වෛද්‍යවරයාගේ අදහස ශරීරයේ පිටුපස හෝ තට්ටම් මත කිසිදු තුවාලයක් දක්නට නොලැබුණ බවයි. කෙසේ වෙතත්, ලබා දී ඇති ඉතිහාසය ශරීරයේ අඛණ්ඩ තුවාල ඉතිරි නොකර වුවද සිදුවිය හැකි බවට දක්වා ඇත. එබැවින් ලබා දී ඇති ඉතිහාසය බැහැර කළ නොහැකි බවයි. තවද විස්තර කර ඇති තුවාල ස්වභාවය (අධිකරණ වෛද්‍ය වාර්තාවේ අංක 1,2,3 තුවාල) රෝගී දරුවාගේ මව විසින් ලබා දෙන ලද රෝග ඉතිහාසය (දරුවා විසින් සිදු කරගන්නා කොනිත්තා ගැනීම්) සමඟ අනුකූල වන බවයි.

අධිකරණ වෛද්‍යවරයාගේ උක්ත මතය අනුව පෙනී යන්නේ වින්දිත දරුවා විසින් විස්තර කරන ලද තුවාල ශරීරයේ අඛණ්ඩ තුවාල ඉතිරි නොකර වුවද සිදුවිය හැකි බැවින් ලබා දී ඇති ඉතිහාසය බැහැර කළ නොහැකි බවය. එම ප්‍රකාශය අනුව දරුවා පවසන පරිදි දරුවාට පාසල තුළ ශාරීරික හිංසනයක් සිදු වීමට හැකියාවක් ඇති බව කොමිෂන් සභාව වෙත පෙනී යන නමුත් මෙම පැමිණිල්ලට අදාළව වින්දිත දරුවා විසින් විස්තර කරන ලද තුවාල නිශ්චිතවම පාසල තුළ සිදු වූවක්ද යන්න තීරණය කිරීමට තරම් ඉදිරිපත්ව ඇති කරුණු ප්‍රමාණවත් නොවේ.

තවද අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් වින්දිත දරුවා උපදේශක මනෝචිකිත්සකවරයෙකු වෙත යොමු කරන ලද බවට සඳහන් කර ඇති අතර ඊට අදාළ වාර්තාවේ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව පොලොන්නරුව ශික්ෂණ රෝහලේ මානසික සෞඛ්‍ය ඒකකයේ උපදේශන මනෝ වෛද්‍ය ජනිත් ගල්හේනගේ මහතා විසින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2025/08/12 දිනැති එම වාර්තාව අනුව වින්දිත දරුවා පළමුව විශේෂඥ

මනෝ වෛද්‍ය පී.ඒ.අයි. විජේනායක මහතා විසින් 2024/08/13 වන දින පරීක්ෂා කරන ලදුව ළමාවියේ විෂාදය නම් තත්වයෙන් පෙළෙන බව නිගමනය කර ඇත. ඉන්පසු තමා විසින් දරුවා 2024/10/22 දින සිට ක්ෂිප අවස්ථාවකදී සායනික පරික්ෂාවට ලක් කර එහිදී ද දරුවා හට ළමා වියේ ඇති වන විෂාද තත්වය සහ ඒ ආශ්‍රිත ශාරීරික රෝග ලක්ෂණ ඇති බව නිගමනය කර ප්‍රතිකාර ආරම්භ කරන ලද බව දන්වා ඇත. තවද දරුවාගේ බුද්ධි මට්ටමද TONI-3 දර්ශකය ආශ්‍රිතව පරීක්ෂා කරන ලදුව එහිදී Below Average 1Q නම් බුද්ධි පිහිටීමක් ඇති බව නිරීක්ෂණය වී ඇති බවත් දැනට දරුවා විෂාදය සඳහා ඖෂධ ලබා ගන්නා අතර ස්ථාවර මානසික තත්වයක සිටින බවටත් කරුණු දක්වා ඇත. තවද ළමා වියේ විෂාද තත්ත්වයට හේතුකාරක ලෙස ජානමය හා පාරිසරික සාධක වල අන්තර් ක්‍රියාවලියක් බලපාන බවත් ඉන්පසු එසේ ඇති වන විෂාද තත්වය ජීව විද්‍යාත්මක, සමාජීය සහ මනෝ විද්‍යාත්මක හේතූන් මත තවදුරටත් ඉදිරියට පැවතීගෙන යන බවයි. විද්‍යාත්මක තොරතුරු මත වින්දිත දරුවාගේ විෂාද තත්වය ඉහත සියලු සාධකවල එකතුවක ප්‍රතිඵලයක් ලෙස ජනනය වී පවතී යන බවට නිමානය කළ හැකි බවට වෛද්‍ය මතය ඉදිරිපත් කර ඇත.

වින්දිත දරුවා සම්බන්ධයෙන් උක්ත විශේෂඥ මනෝ වෛද්‍ය මතය සළකා බැලීමේදී වින්දිත දරුවාට ළමා වියේ විෂාද තත්වය ඇති වීමට හේතු වූ කරුණු පන්තිභාර ගුරුවරිය නිසා ඇති වූ තත්වයක්ද නැද්ද යන්න නිශ්චිතව කිව නොහැකි අතර එම සිදු වීම පමණක් මෙම තත්වය ඇති වීමට බලපා ඇතැයි යන්න ඉදිරිපත්ව ඇති කරුණු අනුව නිශ්චිතව නිගමනය කළ නොහැක. කෙසේ නමුත් පන්ති භාර ගුරුවරිව විසින් වින්දිත දරුවාට පාසල තුළ ශාරීරික හිංසන කර ඇති බවට පාසලේ දරුවන්ගේ ප්‍රකාශ අනුව කරුණු සනාථ වන බැවින් එම ශාරීරික හිංසන පාරිසරික සාධකයක් ලෙස දරුවාට මානසික වශයෙන් බලපෑමේ යම් හැකියාවක් පවතින බැවින් එම කරුණු බැහැර කළ නොහැකි බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. එනම් එකී ශාරීරික දඬුවම් වින්දිත දරුවාගේ මානසික තත්වය කෙරෙහි ද බලපෑ හැකි බවයි.

- මීලඟට කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලද්දේ වින්දිත දරුවාගේ අධ්‍යාපන අයිතිය අහිමි කිරීම සම්බන්ධයෙන් වන අතර පැමිණිල්ලෙන් දක්වා ඇති පරිදි වින්දිත දරුවාගේ අධ්‍යාපන අයිතිය මාස 08කට ආසන්න කාලයක් අහිමි වී ඇත. විශේෂයෙන්ම වින්දිත දරුවා වයස අවුරුදු 08ක බාල වයස්කාර දරුවකු වන අතර අනිවාර්ය අධ්‍යාපනය ලැබීමේ අයිතිවාසිකම එම දරුවාටද හිමි වේ. ඒ අනුව එකී අයිතිය තහවුරු කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයන් විසින් කටයුතු කර ඇති ආකාරය කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලදී.

එහිදී වින්දිත දරුවාගේ මවගේ කරුණු දැක්වීම් අනුව පෙනී යන්නේ 2024 වර්ෂයේ ජුනි මස සිට වින්දිත දරුවාට ඇති වූ ළමා වියේ විෂාද තත්වය පිළිබඳ හා ඊට අදාළව ලබා ගත් ප්‍රතිකාර මත දරුවා පාසල් නොපැමිණි බව සඳහන් කරමින් වෛද්‍ය වාර්තාද ඇතුළත් ලිඛිත ප්‍රකාශයක් 2024/08/30 වන දින විදුහල්පතිතුමා වෙත ලබා දී ඇති බවය. එම ලිඛිත ප්‍රකාශයේ පිටපතක් පැමිණිලි පාර්ශවය විසින් 2025/05/31 දින මෙම කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ල ගොනු කරන අවස්ථාවේදීම ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. නමුත් පළමු වගඋත්තරකාර පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් මෙම කොමිෂන් සභාව හමුවේ 2025/07/01 පැවති පරීක්ෂණ අවස්ථාවේදී හා මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2025.07.05 දිනැති වාර්තාවේ ඊට අදාළව කරුණු දක්වා ඇත්තේ එවැනි ලිපියක් දරුවාගේ මව විසින් තමාට ලබා නොදුන් බවත් වින්දිත දරුවා මානසික පීඩනයකින් සිටින බව මව ප්‍රකාශ කළ ද එම වෛද්‍ය වාර්තා පාසලට භාර දී තිබුනේ අස්වීම ඉල්ලීමට මව පැමිණි දිනයේ බවත් වින්දිත දරුවාගේ අසනීප තත්වය පිළිබඳ තමා දැනුවත් වන්නේ 2024 ඔක්තෝබර් මාසයේදී පමණ බවටත් ලෙස බව නිරීක්ෂණය වේ. නමුත් මනම්පිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කරන ලද වාර්තාව සමඟ ඉදිරිපත් කර ඇති ලේඛනයන්හි වින්දිත දරුවාගේ මව වන ඩී.එම්. දිල්රුක්ෂි දිසානායක යන අය විසින් දරුවා පාසල් නොඑවීම සම්බන්ධයෙන් විදුහල්පතිතුමා අමතා ඇති 2024/08/30 දිනැති ලිපියෙහි පිටපතක් මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

තවද පළමු වගඋත්තරකාර පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිගේ 2025.07.05 දිනැති වාර්තාවේ කරුණු දැක්වීම් අනුව පංතිභාර ගුරුවරිය දැනුවත් නොකර 2024.08.28 දින වන විට වින්දිත දරුවා අඛණ්ඩව පාසල් නොපැමිණි දින ගණන 06ක් බවත් ඒ අනුව 2024.08.28 දින පවත්වන ලද පාසල් පැමිණවීමේ කමිටු රැස්වීම අනුව 2024.09.02 වන දින වින්දිත දරුවාගේ භාරකරු වන මව පාසලට කැඳවා තොරතුරු විමසා කමිටුවේ සාකච්ඡා කර ඇති බවට ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. තවද 2024.08.28 පංතිභාර ගුරුතුමිය විසින් උපදේශන ගුරුවරිය දැනුවත් කර මව පාසලට පැමිණ පසු හමුවන ලෙස දන්වා ඇති බවටද ලේඛන ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2024.09.02 මව හෙවත් භාරකරු විදුහල්පති හමු වීමට පැමිණ ඇති බවත් පංතිභාර ගුරුවරිය හා උපදේශන භාර ගුරුවරිය හමුවන ලෙස මවට උපදෙස් ලබා දී ඇති නමුත් පංතිභාර ගුරුවරිය හා උපදේශන ගුරුවරිය හමුවී නොමැති බවටත් එහි වැඩිදුරටත් දක්වා ඇත.

එසේම සිරිපුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් පැමිණිල්ලට අදාළව මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇති වාර්තාව සමඟ ලබා දී ඇති ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ තොරතුරු සටහන් පොතේ පිටු අංක 383, ඡේදය 19හි වින්දිත දරුවාගේ මව

විසින් දරුවාට පහරදීමක් සම්බන්ධව සිදු කරන ලද පැමිණිල්ලට අදාළව පො/දිඹු/ සුගලාදේවි ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති වන චන්ද්‍රලාල් රාජපක්ෂ යන අය විසින් 2024.11.04 දින ලබා දී ඇති ප්‍රකාශය වෙත අවධානය යොමු කරන ලදී. එම ප්‍රකාශයෙහි විදුහල්පති විසින් දක්වා ඇත්තේ 2024 අගෝස්තු මාසයේ සිට වින්දිත දරුවාගේ දීර්ඝ කාලීනව අඛණ්ඩව පාසලට පැමිණීම දුර්වලවීම නිරීක්ෂණය වීම මත 2024/08/28 වන දින පාසල් පැමිණවීමේ කමිටුවේදී යෝජනා වූ පරිදි දරුවාගේ භාරකරු වන මවට කළ දැනුම්දීම අනුව 2024.09.02 වන දින තමා හමුවීමට පැමිණි බවයි. එහිදී දරුවා මානසික පීඩනයකින් පෙළෙන බැවින් පාසලට පැමිණීමට නොහැකි බව මව විසින් ප්‍රකාශ කළ බවත් ඒ අනුව මේ සම්බන්ධව පන්ති භාර ගුරුවරිය හා පාසලේ උපදේශන ගුරුවරිය දැනුවත් කරන ලෙස තමා දරුවාගේ භාරකරු වන මවට දැනුම් දුන් බවටත් දක්වා ඇති අයුරු නිරීක්ෂණය වේ. තවද දරුවා මානසික පීඩනයකින් පෙළෙන බවට ලිපියක් මගින් පාසල දැනුවත් කරන ලෙසටද මවට දැනුම් දුන් බවට විදුහල්පති විසින් පොලිසිය වෙත ප්‍රකාශ ලබා දී ඇත. ඒ පිළිබඳ 2025.09.02 දින පාසල් ලොග් සටහන්හි පොතෙහි සටහන් යොදා ඇති අයුරුද නිරීක්ෂණය වේ.

උක්ත කරුණු අනුව වින්දිත දරුවාගේ මව විසින් 2024.09.02 දින දරුවාගේ රෝගී තත්වය හා ඒ මත දරුවාගේ පාසල් නොපැමිණීම සම්බන්ධව විදුහල්පතිතුමා දැනුවත් කර ඇතැයි යන්න තහවුරු වේ. තවද විදුහල්පති විසින් මනම්පිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අමතා ලබා දී ඇති ප්‍රකාශය ඇතුලත් වාර්තාවෙහි 2025.09.02 දින දරුවාගේ මව තමා හමුවට පැමිණි බව සඳහන් කර ඇති නමුත් දරුවා මානසික පීඩනයකින් පෙළෙන බව හා එබැවින් පාසලට පැමිණීමට නොහැකි බව මව ප්‍රකාශ කළ බවක් සඳහන් කර නැති අයුරුද නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම කොමිෂන් සභාව හමුවේ 2025/07/01 පැවති පරීක්ෂණ අවස්ථාවේදී හා මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2025.07.05 දිනැති වාර්තාවේ විදුහල්පතිතුමා විසින් එම කරුණු ප්‍රතික්ෂේප කරමින් දරුවාගේ අසනීප තත්වය පිළිබඳ තමා දැනුවත් වන්නේ 2024 ඔක්තෝබර් මාසයේදී පමණ බවට සිදු කරන ලද ප්‍රකාශ හා කරුණු දැක්වීම් සාවද්‍ය බව තහවුරු වේ.

- එසේ දරුවාගේ අසනීප තත්වය පිළිබඳව දැනුවත් කර තිබියදීත් විදුහල්පතිතුමා විසින් පාසලේ විනය කමිටු රැස්වීම් ආදිය පවත්වමින් වින්දිත දරුවා වන ආර්. එම්.මෙනුක අයෝධ්‍ය දරුවාගේ නොපැමිණීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමත් හා 1963/30 චක්‍රලේඛනය අනුව දීර්ඝ කාලීනව පාසල් නොපැමිණෙන හා ගිලිහෙන දරුවන් පිළිබද මාසික වාර්තාවන්ට ( 2024 සැප්තැම්බර් සිට 2025 පෙබරවාරි දක්වා) මෙම වින්දිත දරුවාගේ නම ද ඇතුළත් කොට කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට යොමු කිරීමත් මෙම ලිපියේ පිටපත් අනිවාර්ය අධ්‍යාපන නියෝග චක්‍රලේඛනය අනුව අධීක්ෂණ කමිටුවේ සාමාජිකයන් වන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ, ග්‍රාම නිළධාරී, පරිවාස හා ළමාරක්ෂණ නිලධාරි හා පොලිසිය වෙත දැනගැනීම සඳහා 2024.10.11 දින යොමු

කිරීමත් සිදු කර ඇති බව නිරීක්ෂණය වන අතර එය ගැටලු සහගත තත්වයකි. මෙය හිංසනයට ලක් වූ පාර්ශවය තවදුරටත් හිංසනයට ලක් වීමක් බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම යම් වරදක් සිදු වූ අවස්ථාවකදී එය නිවැරදි කර ගැනීමට යම් ක්‍රමවේදයක් අනුගමනය කළ හැකි වුවත් එමඟින් තවත් පාර්ශවයකට අගතියක් සිදු වන ලෙස එම ක්‍රියාමාර්ග ගැනීම වරදක් බව නිරීක්ෂණය වේ. විදුහල්පතිතුමා විසින් මෙම සිදුවීමේදී ගතයුතුව තිබූ ක්‍රියාමාර්ග නිසි කලට නොගැනීම නිසා මෙම ගැටලුව පොලිස් ස්ථානය දක්වා ගමන් කර ඇති බව පෙනී යන අතර එහිදී විදුහල්පති විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග නිසි කලට සාධාරණ ලෙස ගනු ලැබුවේ නම් මෙම ගැටලුව මේ දක්වා ගමන් නොකර තිබීමට හැකියාව තිබිණි. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය යටතේ හා ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය යටතේ ද 1960 අධ්‍යාපනය තුළ වෙනස්කොට සැළකීමට එරෙහිව වූ ප්‍රඥප්තියට අනුවද 1989 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය හා අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි අනුව ද සළකා බැලීමේදී ළමුන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරිමට රජය බැඳී සිටින අතර රජය සතු වගකීම් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉටු කරමින් එය ක්‍රියාවට නැංවීමට පියවර ගැනීමට අදාළව නිකුත් කරන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට සියළු පාසල් බැඳි සිටින බැවින් වග උත්තරකාර පාසල ද එකී වගකීමට බැඳී සිටී. නමුත් මෙම සිද්ධියේදී වින්දිත දරුවා පාසල් නොපැමිණීමට හේතුව දරුවාගේ දෙමාපියන් විසින් දන්වා තිබියදීත් පළමු වගඋත්තරකාර විදුහල්පති විසින් එවැන්නක් දන්වා නොමැති බව ප්‍රකාශ කරමින් වින්දිත දරුවාට අගතිදායක ලෙස අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි අනුව කටයුතු කිරීම බරපතල වරදක් බව කොමිෂන් සභාව වෙත පෙනී යයි.

- තවද දරුවාගේ මව විසින් 2024.09.02 දින දරුවාගේ රෝගී තත්වය හා පන්තිභාර ගුරුවරියගෙන් සිදුවනවා යැයි කියන කායික හා මානසික හිංසන පිළිබඳවත් ඒ මත දරුවාගේ පාසල් නොපැමිණීම සම්බන්ධවත් විදුහල්පතිතුමා දැනුවත් කර තිබියදී විදුහල්පතිතුමා විසින් ගුරුවරිය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය වේ. පළමු වගඋත්තරකාර විදුහල්පතිගේ 2025.07.05 දිනැති වාර්තාව අනුව විදුහල්පතිතුමා විසින් අදාළ ගුරුවරිය සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව දක්වා ඇත්තේ 2024.10.15 වන දින රැස් වූ විනය කමිටුවේ දී 03 ශ්‍රේණියේ ගුරුවරිය වන ශිවන්ති පෙරේරා මිය වෙත කර ඇති චෝදනාව පිළිබඳ සාකච්ඡා කර ඒ අනුව ගුරු මණ්ඩලය සඳහා අවවාද හා උපදෙස් ලබා දී තිබෙන බවටය. ඒ අනුව විදුහල්පති විසින් මාසයකට අධික කාලයක් අදාළ ගුරුවරිය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් විශේෂයෙන්ම එවැනි බරපතල චෝදනාවක් ගුරුවරයෙකු වෙත එල්ල වන අවස්ථාවකදී නිසි විමර්ශනයක් සිදු කර නොමැති බවත් නිරීක්ෂණය වේ. එසේ සිදු නොකර වින්දිත දරුවාගේ පාසල් නොපැමිණීම සම්බන්ධයෙන් පමණක් විවිධ රාජ්‍ය ආයතන වෙත දැනුම් දෙමින් වින්දිත දරුවාට හානිදායක ලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. පාසලක පරිපාලනය, විනය සම්බන්ධයෙන් මෙන්ම සිසු දරුවන්ගේ සුභ සිද්ධිය උදෙසා වගකිව

යුතු පළමු නිලධාරියා වශයෙන් මෙම දෙමාපියන් විසින් වගඋත්තරකාර ගුරුවරියගේ ක්‍රියාකලාපය පිළිබඳව දැනුම් දුන් පළමු අවස්ථාවේදීම සොයා බලා නිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතු වුවද එම වගකීම පැහැර හරිමින් නොසැලකිලිමත් ආකාරයෙන් ගුරුවරියට පක්ෂපාති ලෙස විදුහල්පතිවරයා කටයුතු කර ඇති බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. ශ්‍රී ලංකාව තුළ දරුවන් සම්බන්ධයෙන් සුවිශේෂී නීතිමය රාමුවක් පවතින පසුබිමක සහ අධ්‍යාපනය ලබන සෑම දරුවෙක්ටම සමාජ ගරුත්වයක් සහ අයිතිවාසිකම් පවතින බව ඉගැන්විය යුතු හා ආදර්ශමත් විය යුතු විදුහල්පතිවරයෙකු වශයෙන් හා රජයේ වගකිවයුතු නිලධාරියෙකු වශයෙන් පළමු වගඋත්තරකාර විදුහල්පති විසින් මෙම සිදුවීමේදී කටයුතු කර ඇති ආකාරය පාසලක විදුහල්පති භූමිකාවට නුසුදුසු ආකාරයක් වන බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය කරයි.

- 2024.10.04 වන දින වින්දිත දරුවාගේ පියා දරුවා පාසලෙන් අස් කර ගැනීම සඳහා ගිය අවස්ථාවේ දී දරුවා භාර දීම සිදු කර ඇත්තේ දරුවාගේ මව විසින් වන බැවින් අස්වීම ලබා දීමට භාරකරු වන මව පැමිණිය යුතු ලෙසත් එදින දරුවාගේ පියා රැගෙන ගිය ලිපියෙහි පන්තිභාර ගුරුයවරියගේ පීඩනය නිසා දරුවා පාසලෙන් ඉවත් කර ගන්නා බවට සඳහන් වීම ගැටලු සහගත බැවින් ඒ සඳහා වෛද්‍ය වාර්තාවක් සමඟ දරුවාගේ මවට පැමිණෙන ලෙසට විදුහල්පති විසින් දරුවගේ පියාව දැනුවත් කර ලද බවත් එසේ නොමැති නම් ඔවුන්ගේ සිය කැමැත්තෙන් අස්වීම ඉල්ලීම් කරන ලෙසට විදුහල්පති විසින් දැන්වූ බවටත් පැමිණිලි පාර්ශවය විසින් කරුණු දක්වා ඇත. ඒ සම්බන්ධව පළමු වගඋත්තරකාර විදුහල්පතිගේ 2025.07.05 දිනැති වාර්තාවෙන් මෙම කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත්තේ 2024.10.04 වන දින වින්දිත දරුවා පාසලින් ඉවත් කර ගැනීමට දරුවාගේ පියා පාසලට පැමිණ ඉල්ලීම් කර තිබූ බවත් දරුවාගේ භාරකරු පියා නොවන බැවින් අස්වීම් ලබා දී නොමැති බවටත්ය. තවද 2024.10.14 දින දරුවාගේ මව දරුවාගේ අස්වීම ලිඛිතව ඉල්ලා ඇති බවත් අස්වීම නිකුත් කිරීමට යොමු කරන ලද ලිපියේ සඳහන් කරුණු ගැටළු සහගත නිසාත් දීර්ඝකාලීන නොපැමිණීම් සම්බන්ධව මේ වන විට කළාප කාර්යාලය දැනුවත් කර ඇති නිසාත් තමා කළාප කාර්යාලයෙන් උපදෙස් පැතීමට ඇති නිසා පසු දින පැමිණ අස්වීම ලබා ගන්නා ලෙස දරුවාගෙ මව දැනුවත් කරන ලද බවටත් එහි දක්වා ඇත. නමුත් සිරිපුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් පැමිණිල්ලට අදාළව මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇති වාර්තාව සමඟ ලබා දී ඇති සිරිපුර පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ තොරතුරු සටහන් පොතේ පිටු අංක 383, ඡේදය 19හි වින්දිත දරුවාගේ මව විසින් දරුවාට පහරදීමක් සම්බන්ධව කරන ලද පැමිණිල්ලට අදාළව පො/දිඹු/ සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති වන චන්ද්‍රලාල් රාජපක්ෂ විසින් 2024.11.04 දින ලබා දී ඇති ප්‍රකාශයෙහි සඳහන් වන්නේ **"2024.10.04 වන දින මෙම දරුවාගේ පියා දරුවා පාසලෙන් අස් කර ගැනීම සඳහා පැමිණි අතර දරුවා භාර දීම කර ඇත්තේ දරුවාගේ මව බැවින් අස්වීම ලබා**

දිමට මවට පැමිණෙන ලෙසත්, ලිපියේ සඳහන් වුයේ 03 ශ්‍රේණිය පන්තිභාර ගුරුවරියගේ පීඩනය නිසා දරුවා පාසලෙන් ඉවත් කර ගන්නා බවට බැවින් ලිපියේ සඳහන් කරුණු ගැටලු සහගත නිසා ඒ සඳහා වෛද්‍ය වාර්තාවක් සමඟ දරුවාගේ මවට පැමිණෙන ලෙසට දැනුවත් කලා. නැත්නම් ඔවුනගේ සිය කැමැත්තෙන් අස්වීම ඉල්ලීම් කරන ලෙසට දැන්වූවා" යනුවෙන්ය. මේ අනුව පැමිණිලි පාර්ශවය විසින් ඒ සම්බන්ධව කර ඇති ප්‍රකාශ සත්‍ය බව පෙනී යන අතර වගඋත්තරකාර විදුහල්පති විසින් පොලිස් ස්ථානය වෙත කර ඇති ප්‍රකාශ හා පැමිණිලි පාර්ශවය විසින් ඒ සම්බන්ධව කර ඇති ප්‍රකාශ සමාන බවද නිරීක්ෂණය වේ. මේ තුළින් පැහැදිලි වන්නේ වින්දිත දරුවාට පන්ති භාර ගුරුවරියගෙන් සිදුවන පීඩන සම්බන්ධව දෙමාපියන් විසින් විදුහල්පති දැනුවත් කර තිබියදීත් පළමු වගඋත්තරකාර විදුහල්පතිතුමා විසින් ඒ පිළිබඳ තොරතුරු වසන් කර අදාළ ගුරුවරිය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කර ඇති ආකාරයයි.

- ඕනෑම අවස්ථාවක දෙමාපියන්ට පැමිණ හෝ දුරකථනයෙන් හෝ අමතා පන්තිභාර ගුරුවරයා වෙත දරුවන්ගේ ගැටලු ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දී තිබූ නමුත් වින්දිත දරුවාගේ දෙමාපියන් 2024.10.28 සිරිපුර පොලිස් ස්ථානයේදී කරුණු ඉදිරිපත් කරන තුරු දරුවාගේ ගැටලු පිළිබඳව කිසිදු දිනෙක තමා සමඟ සාකච්ඡා කර නොමැති බවට 2025.07.05 දිනැති වාර්තාව මඟින් දෙවන වගඋත්තරකාර පන්තිභාර ගුරුවරිය විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත. නමුත් පළමු වගඋත්තරකාර විදුහල්පතිගේ 2025.07.05 දිනැති වාර්තාව අනුව 2024.10.15 වන දින රැස් වූ විනය කමිටුවේ වින්දිත දරුවාගේ මව විසින් 03 ශ්‍රේණියේ ගුරුවරිය වන ශිවන්ති පෙරේරා මිය වෙත කර ඇති චෝදනාව පිළිබඳ සාකච්ඡා කරන ලද බවට ප්‍රකාශ කරමින් ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව 2024.10.28 දිනට පෙර අදාළ ගුරුවරිය තමාට එල්ල වූ චෝදනාව හා දරුවාගේ ගැටලු සම්බන්ධයෙන් දැනුවත්ව සිටි බව තහවුරු වේ.

- තවද 2025.07.01 දින මෙම කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද පාසල් පැමිණවීමේ කමිටුව නමින් කමිටුවක් පවත්වාගෙන යන බවට වූ ලේඛනයෙහි එම වාර්තා කිරීම් ආරම්භ කර ඇත්තේ 2024.08.28 දින සිට බව නිරීක්ෂනය වූ අතර ඊට පෙර වෙනත් කිසිදු සිද්ධියක් සම්බන්ධව එම පොතේ සටහන්ව නොතිබිණි. ඒ අනුව එම ලේඛනය මෙම සිද්ධිය පදනම් කර ගෙන සකස් කරන ලද එකක් බව නිරීක්ෂණය විය. මේ අනුව පළමු හා දෙවන වගඋත්තර පාර්ශවයන් විසින් විවිධ අවස්ථාවන්හිදී පරස්පර විරෝධී අසත්‍ය ප්‍රකාශ සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

- වින්දිත දරුවාගේ මව විසින් තම දරුවාගේ රෝගී තත්වය හා පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලය තුළ සිදු වූ හිංසනය සම්බන්ධයෙන් දැනුවත් කරමින් වින්දිත දරුවාට වෙනත් පාසලක් ලබා ගැනීම සඳහා දරුවන් සිරිපුර ජාතික පාසලට ඇතුළත් කරගන්නා ලෙසට 2025/01/07 දිනැතිව දිඹුලාගල කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් සිදු කර ඇති අතර එම ලිපියේ පිටපතක් මුල් පැමිණිල්ල සමඟ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම සිද්ධියට අදාළව පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති විසින් වාර්තාවක් 2025/07/25 දින දිඹුලාගල කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර ඇති අයුරු නිරීක්ෂණය වේ. තවද පො/දිඹු සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ දරුවාට හිංසන සිදු කළ බවට පැමිණිල්ලෙන් චෝදනා ලැබූ ශිවන්ති පෙරේරා ගුරුවරියගේ ලිඛිත ප්‍රකාශය 2025/07/22 දින දිඹුලාගල කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර ඇති බවට දිඹුලාගල කළාප අධ්‍යාපන කාර්යාලය විසින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ලේඛන අනුව නිරීක්ෂණය වේ. මෙම කරුණු අනුව පෙනී යන්නේ වින්දිත දරුවාගේ දෙමාපියන් තම දරුවාගේ ගැටලුව පිළිබඳ කළාප අධ්‍යාපන කාර්යාලය වෙත දැනුම් දී තිබියදීත් 2025 ජූලි මාසය වන තෙක් කලාප කාර්යාලය වෙතින් දරුවාට පාසලක් ලබා දීමට හෝ චෝදනා ලැබූ පාර්ශවයන් සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැති බවය. ඒ අනුව වින්දිත දරුවාට වෙනත් පාසලකට යාම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල සහයෝගය පැමිණිලිකාර මවගේ ඉල්ලීම පරිදි ඉටු කරදීමට තුන්වන වගඋත්තරකාර දිඹුලාගල කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අපොහොසත්ව ඇති බව පෙනී යයි.

- තවද පැමිණිලි පාර්ශවය විසින් තම දරුවාගේ ගැටලුව සම්බන්ධයෙන් 2024.11.10 දින ජනාධිපතිතුමා වෙත යොමු කර ඇති ලිපියක් ප්‍රකාරව ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් උතුරුමැද පළාත් ප්‍රධාන ලේකම් වෙත 2024.12.10 දිනැති ලිපිය යොමු කර ඇත. තවද දරුවාගේ පියා වන ආර්.එම්.මහින්දපාල යන අය විසින් තම දරුවාට පාසලෙන් සිදු වූ අසාධාරණය නිසා වෙනත් පාසලකට ඇතුළත් කිරීම සම්බන්ධව ජනාධිපති වෙත ඉදිරිපත් කරන ලද ලිපිය ප්‍රකාරව එම ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බලන ලෙසට දන්වමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2025.01.10 දිනැතිව ලිපියක් යොමු කර ඇත. තවද පැමිණිලි පාර්ශවය විසින් දිඹුලාගල කළාප අධ්‍යාපන කාර්යාලය වෙත 2025/01/07 පැමිණිලි කිරීමෙන් පසුව 2025.03.05 වන දින නැවතත් කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ හරහා කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලිඛිතව ඉල්ලීම් කර ඇති බවට ලේඛන ඉදිරිපත් කර ඇත. තවද දිඹුලාගල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇති වාර්තාවේ දක්වා ඇත්තේ මෙම පැමිණිල්ල සම්බන්ධයෙන්ම 2024.11.10 දින වින්දිත දරුවාගේ මව විසින් ජනාධිපතිතුමා වෙත යොමු කර ලිපියක සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා ගැනීමට දිඹුලාගල කලාප අධ්‍යාපන කාර්යාලය වෙත 2025.01.15 දින ඉදිරිපත් කළ

බවය. ඉන්පසු නැවත 2025.07.16 දිනැති ලිපියෙන් එම පරීක්ෂණ මණ්ඩලය සඳහා පරිපාලන නිලධාරිනිය පත් කළ බවටද කරුණු දක්වා ඇත. මෙකී සියලු කරුණු අනුවද පෙනී යන්නේ වින්දිත දරුවාගේ දෙමාපියන් හා ඉහළ බලධාරී ආයතන වෙතින් දිඹුලාගල කළාප අධ්‍යාපන කාර්යාලය වෙත සිද්ධිය පිළිබඳ දැනුම් දී තිබියදීත් 2025 ජූලි මාසය වන තෙක් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවය. පැමිණිලි පාර්ශවය මෙම කොමිෂන් සභාව හමුවේ ගොනු කරන ලද පැමිණිල්ල සම්බන්ධව 2025.07.01 දින පැවති පරීක්ෂණයෙන් පසුව එම ක්‍රියාමාර්ග ගෙන ඇති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව දිඹුලාගල කළාප අධ්‍යාපන කාර්යාලය විසින් සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කළ ද එහි ප්‍රමාදවීමක් පැහැදිලිව නිරීක්ෂණය වන අතර මෙම කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ අවස්ථාවේදීද කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ නියෝජනය කරමින් පැමිණි නිලධාරියා විසින් එය පිළිගන්නා ලදී. තවද දිඹුලාගල කළාප අධ්‍යාපන කාර්යාලය විසින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කරන ලද විමර්ශන වාර්තාව අනුවද පාසලේ අහඹු ලෙස තොරා ගන්නා ලද 4 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ගැහැණු ළමුන් දෙදෙනෙකු හා පිරිමි ළමුන් තිදෙනෙකුගෙන් ප්‍රකාශ ලබා ගෙන ඇති බවට සඳහන් කර ඇතත් එම ප්‍රකාශයන්හි ලබා ගත් දිනයන් සටහන්ව නැති බව නිරීක්ෂණය වන අතර එම පරීක්ෂණ කටයුතු සිදු කිරීමේ යම් අඩුපාඩු පවතින බවද පෙනී යයි. මේ අනුව තෙවන වගඋත්තරකාර දිඹුලාගල කළාප අධ්‍යාපන කාර්යාලය මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය සතුටුදායක නොවන බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1989 නොවැම්බර් මස 20 වන දින සම්මත කර ගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට (Convention on the Rights of the Child) පාර්ශවකරුවෙකු ලෙස ශ්‍රී ලංකාව 1991 වසරේදී අත්සන් තබා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නෛතිකමය වශයෙන් බැඳී සිටී. එකී ළමා අයිතිවාසිකම් සම්මුතියේ 37 වන වගන්තියෙහි, " රාජ්‍ය පාර්ශවයන් සහතික කළ යුත්තේ: (අ) කිසිම දරුවෙකු වධහිංසාවට හෝ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන්සහගත සැලකිලි හෝ දඬුවම් වලට ලක් නොකළ යුතුය " යනුවෙන් සඳහන් කර තිබේ.

එවන් වූ පසුබිමක මෙකී පැමිණිල්ල අනුව අගතියට පත්ව ඇත්තේ වයස අවුරුදු 08ක 03 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවෙක් බව පෙනීයයි. මෙම පැමිණිල්ලට අදාළව ඉදිරිපත්ව ඇති සියලුම සාක්ෂි හා තොරතුරු කොමිෂන් සභාව විසින් විමර්ශනයට ලක්කරන ලද අතර ඒ අනුව දෙවන වගඋත්තරකාර ගුරුවරිය විසින් ආර්.එම්.මෙනුක අයෝධ්‍ය යන වින්දිත දරුවාට පාසල තුළ දී පහරදී ඇති බවට පාසලේ දරුවන්ගේ ප්‍රකාශ මඟින්ද වින්දිත දරුවාගේ හා දෙමාපියන්ගේ ප්‍රකාශ මගින්ද සනාථ වී ඇති බැවින් 2වන වගඋත්තරකාර ගුරුවරිය වන සෙල්ලප්පෙරුමගේ නිරක්ෂි නිලූෂිකා ශිවන්ති පෙරේරා යන අය විසින් පැමිණිල්ලෙහි අගතියට පත් දරුවා වෙත ශාරීරික දඬුවම් ලබා දෙමින් පාසල් චක්‍රලේඛ අභිබවනය කරමින් කටයුතු කර ඇති බව නිගමනය කරනු ලැබේ. අධිකරණ වෛද්‍යවරයාගේ මතය අනුව වින්දිත

දරුවා විසින් විස්තර කරන ලද තුවාල ශරීරයේ අඛණ්ඩ තුවාල ඉතිරි නොකර වුවද සිදුවිය හැකි බැවින් ලබා දී ඇති ඉතිහාසය බැහැර කළ නොහැකි බව දක්වා ඇති අතර එම ප්‍රකාශය අනුව දරුවා පවසන පරිදි දරුවාට පාසල තුළ කායික හිංසනයක් ශරීරයේ අඛණ්ඩ තුවාල ඉතිරි නොකර වුවද සිදු වීමට හැකියාවක් ඇති බව පෙනී යන නමුත් පැමිණිල්ලට අදාළව වින්දිත දරුවා විසින් විස්තර කර ඇති තුවාල නිශ්චිතවම පාසල තුළ සිදු වූවක්ද යන්න තීරණය කිරීමට තරම් ඉදිරිපත්ව ඇති කරුණු ප්‍රමාණවත් නොවේ.

ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2021 පෙබරවාරි 12 දින නිකුත් කළ SC/FR/97/2017 දරණ එච්. එම්. කරුණාපාල එදිරිව ජේ. පී. කේ. සිරිවර්ධන ඇතුළු පිරිස සම්බන්ධයෙන් වූ ප්‍රසිද්ධ නඩු තීන්දුවක් වන පුහුල්වැල්ල මධ්‍ය මහා විද්‍යාලයේ කලා ගුරුවරයා විසින් ශිෂ්‍යයෙකුට පහරදීම සම්බන්ධයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව මගින්, ශාරීරික දඬුවම කොලනි යුගයේ ආරම්භ වූ ක්‍රියාවක් වන බවත්, නූතන ශ්‍රී ලාංකීය සමාජය තුළ එවැනි ක්‍රියාකරුවන්ට ඉඩක් නැති බවත් පෙන්දී තිබේ.

තවද එකී තීන්දුව මගින් ඉහත දක්වා ඇති පරිදි, "ගුරුවරු යනු දරුවන්ට මහ පෙන්වන සහ උපදෙස් දෙන පුද්ගලයින් වශයෙන්, හික්මවීමේ නාමයෙන්, ආවේගශීලීව දරුවන්ට හානි කරන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්හි යෙදීමෙන් සුදුසු ආදර්ශයක් නොදෙන බවත්, මන්ද දරුවන් මෙම හැසිරීම ඉදිරියට ගෙන යාමට ඉඩ ඇති බවත් සඳහන් කර තිබේ. ගුරුවරුන් දරුවන් තුළ ස්වයං විනය සහ අවිහිංසාව ඇති කිරීමට අරමුණු කරන්නේ නම්, ඔවුන් තමන් තුළම එම වටිනාකම් ඇති කිරීමෙන් ආදර්ශයක් තැබිය යුතුය. මෙය දුෂ්කර ප්‍රායෝගික ක්‍රියාවක් වුවද, යමෙකු දරුවන්ගෙන් මෙය අපේක්ෂා කරන්නේ නම්, ඔවුන් එය පිළිබිඹු කර තමන්ගෙන්ම එය අපේක්ෂා කළ යුතුය" යනුවෙන් නියෝග කර තිබේ.

2016.04.29 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 12/2016 හි 2.0 ශාරීරික දඬුවම් යන්නෙහි 2.1 යටතේ, " ශිෂ්‍යයින්ගේ ආරක්ෂාව සැලසීමේ දී දෙමාපියන්ට හා සමාන වගකීමක් ගුරුවරුන්ට ද හිමිවේය, යන සංකල්පය පදනම් කරගත් " in Loco Parentis " යන සංකල්පය පදනම් කර ගෙන පාසල තුළ දී අපේක්ෂිත චර්යාවන්ට නොගැළපෙන වයාවන් දක්වන සිසුන්ගේ එම අයෝග්‍යා චර්යාවන් වැළැක්වීම සඳහා ශාරීරිකව වේදනාවක් ඇතිවන අන්දමින් කරන දඬුවමක් ශාරීරික දඬුවමක් ලෙස හඳුන්වනු ලැබේ..... ඒ නිසා සිසුවා තුළ චර්යාමය වෙනසක් අති කිරීමේ චේතනාවෙන් සද්භාවයෙන් යුතුව වුව ද කිසිදු ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට ශාරීරිකව පීඩනයක් විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් වැළකී සිටීමට සියලුම දෙනා වගබලා ගත යුතු වේ " යනුවෙන් නීතිමය විධිවිධාන නිකුත් කර තිබේ.

තවද එකී චක්‍රලේඛනයේ 2.4 වගන්තිය ප්‍රකාරව "පාසල් විනය පවත්වා ගෙන යාමේ අරමුණින් වුවද සිසුන්ට දඬුවම් දීම සිදු කළහොත් පහත සඳහන් නීති ක්‍රියාමාර්ග වලට මුහුණ දීමටසිදුවනු ඇත" යනුවෙන් දක්වා ඇත. එමෙන්ම උක්ත චක්‍ර ලේඛනයෙහි 2.4 (i) හි දක්වා ඇති පරිදි, " ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා xi පරිච්ඡේදයේ

126 වැනි වගන්තිය අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැක" යනුවෙන් ද දක්වා ඇත. ඒ අනුව 2.4 (iii) හි" අධ්‍යාපනයට අදාළ බලධරයන් විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණ වලින් ශාරීරික දඬුවම් ලබාදී ඇති බව ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය අනුව විනය ක්‍රියා මාර්ග ගනු ලැබිය හැක" යනුවෙන් දක්වා ඇත. ඒ අනුව මෙකී සියලු නීතිමය තත්වයන් අභිබවනය කරමින් 2වන වගඋත්තරකාර ගුරුවරිය වන සෙල්ලප්පෙරුමගේ නිරක්ෂි නිලූෂිකා ශිවන්ති පෙරේරා යන අය විසින් කටයුතු කර ඇති බව නිගමනය කරනු ලැබේ.

එසේම පොළොන්නරුව ශික්ෂණ රෝහලේ මානසික සෞඛ්‍ය ඒකකයේ උපදේශන මනෝ වෛද්‍ය ජනිත් ගල්හේනගේ මහතා විසින් වින්දිත දරුවා හට ළමා වියේ ඇති වන විශාද තත්වය සහ ඒ ආශ්‍රිත ශාරීරික රෝග ලක්ෂණ ඇති බව නිගමනය කර ඇති අතර ළමා වියේ විෂාද තත්වයට හේතුකාරක ලෙස ජානමය හා පාරිසරික සාධක වල අන්තර් ක්‍රියාවලියක් බලපාන බවටත් නිගමනය කර ඇත. ඉදිරිපත්ව ඇති කරුණු අනුව දරුවාට මෙම තත්වය ඇති වීමට හේතු වූ කරුණු පන්තිභාර ගුරුවරිය නිසා ඇති වූ තත්වයක්ද නැද්ද යන්න නිශ්චිතව කිව නොහැකි අතර එම සිදු වීම පමණක් මෙම තත්වය ඇති වීමට බලපා ඇති බව නිශ්චිතව නිගමනය කළ නොහැක. කෙසේ නමුත් පන්ති භාර ගුරුවරිය විසින් වින්දිත දරුවාට පාසල තුළ ශාරීරික හිංසන කර ඇති බවට කරුණු සනාථ වන බැවින් පාරිසරික සාධකයක් ලෙස එය දරුවාට මානසික වශයෙන් බලපෑමේ යම් හැකියාවක් පවතින බැවින් එම කරුණ බැහැර කළ නොහැකිය. නිරෝගී දරුවෙකු ලෙස පාසලට ඇත්ළත් කළ දරුවා මානසිත රෝගී තත්වයට පත් ව ඇත්තේ පාසල තුළ සිදු වූ යම් ක්‍රියාවලියක් නිසා නම් එය විශාල ගැටලුවක් වන අතර දෙමාපියන් විසින් දරුවෙකු පාසලට ඇතුලත් කරන්නේ විදුහල්පති හා සහ ගුරුවරුන් පිළිබඳ විශ්වාසයෙන් වන නමුත් පො/සුගලාදේවි ප්‍රථමික විද්‍යාලයේ විදුහල්පති සහ වින්දිත දරුවාගේ පන්තිභාර ගුරුවරිය විසින් එම විශ්වාසය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මෙම සිද්ධියේදී කටයුතු කළ ආකාරය ගැටලුකාරිය. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2012.10.05 දිනැතිව නිකුත් කර ඇති 2012/37 චක්‍රලේඛනයෙහි 5.2 (අ) අනුව පාසල් ශිෂ්‍යයන් සම්බන්ධයෙන් ගුරුවරයා ශිෂ්‍යයින්ගේ ස්ථානීය දෙමාපියන් නම් වූ නීතිමය සංකල්පය සැලකිල්ලට ගෙන සෑම විටම දෙමාපියන් හා දරුවන් තමා වෙත තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීම හා දෙමාපිය භාරකරුවන් කෙරෙහි දරුවන්ගේ විශ්වසනීයත්වය තහවුරු වන ආකාරයට කටයුතු කළ යුතු බව දක්වා ඇත. එම නීතිමය තත්වය වගඋත්තරකාර විදුහල්පති හා ගුරුවරිය විසින් මෙහිදී උල්ලංඝනය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

ඉහත කී සියලු කරුණු අනුව 2වන වගඋත්තරකාර පන්තිභාර ගුරුවරිය විසින් පැමිණිල්ලෙහි අගතියට පත් දරුවා වෙත ශාරීරික දඬුවම් ලබා දී ඇති බව පාසලේ දරුවන්ගේ ප්‍රකාශ අනුව තහවුරු වන අතර මනෝ වෛද්‍ය මතය අනුව එකී ශාරීරික දඬුවම් පාරිසරික සාධකයක් ලෙස වින්දිත දරුවාගේ මානසික තත්වය කෙරෙහිද බලපෑමට යම් හැකියාවක් පවතී. නමුත්, ඉදිරිපත්ව ඇති කරුණු අනුව දරුවාට ඇති වූ ළමා වියේ විෂාදය නම් රෝගී තත්වය පන්තිභාර ගුරුවරියගේ පහරදීම නිසාම ඇති වූ එකක් බවට නිශ්චිතව නිගමනය කිරීමේ හැකියාවක් නොපවතී. කෙසේ වෙතත් අදාල ගුරුවරිය පාසල තුළ දරුවන්ට

පහර දෙන බව හා වින්දිත දරුවාටද පහර දී ඇති බව අනාවරණය වන බැවින් ඒ සම්බන්ධව සුදුසු පියවර ගැනීම අදාළ බලධාරීන්ගේ වගකීම වේ.

තවද ප්‍රාථමික අධ්‍යාපනය ලබන දරුවන් උදෙසා අධ්‍යාපනය ලබා දිය යුතු ආකාරය සම්බන්ධයෙන් විශේෂ චක්‍රලේඛ, විධිවිධාන, මාර්ගෝපදේශ මඟින් ප්‍රථමික අංශ ගුරුවරුන් නිරන්තරයෙන් පුහුණු කිරීම් දැනුවත් කිරීම් සිදු කර තිබිය දී එම සියලු නීතිමය තත්වයන් අභිබවනය කරමින් බාල වයස්කාර දරුවන්ට පාසල තුළ දී පහර දීම සිදු කර ඇති බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වූ වින්දිත දරුවාගේ හා පාසලේ දරුවන්ගේ මූලික අයිතිවාසිකම 2වන වගඋත්තරකාර පන්තිභාර ගුරුවරිය විසින් උල්ලංඝනය කර ඇති බවද මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද වින්දිත දරුවාගේ මව විසින් 2024.09.02 දින දරුවාගේ රෝගී තත්වය හා ඒ මත දරුවාගේ පාසල් නොපැමිණීම සම්බන්ධව විදුහල්පතිතුමා දැනුවත් කර තිබියදීත් විදුහල්පතිතුමා විසින් පාසලේ විනය කමිටු රැස්වීම් ආදිය පවත්වමින් වින්දිත දරුවාගේ නොපැමිණීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමත් හා 1963/30 චක්‍රලේඛනය අනුව දීර්ඝ කාලීනව පාසල් නොපැමිණෙන හා ගිලිහෙන දරුවන් පිලිබඳ මාසික වාර්තාවන්ට වින්දිත දරුවාගේ නම ද ඇතුළත් කොට කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය ඇතුලු රාජ්‍ය ආයතන කිහිපයක් වෙත යොමු කරමින් කටයුතු කිරීම වැරදි සහගත බවත් හිංසනයට ලක් වූ පාර්ශවය තවදුරටත් හිංසනයට ලක්කිරීමක් බව කොමිෂන් සභාව වෙත පෙනී යයි. තවද දරුවාගේ මව විසින් දරුවාගේ රෝගී තත්වය හා පන්තිභාර ගුරුවරියගෙන් සිදුවනවා යැයි කියන කායික හා මානසික හිංසන පිළිබඳවත් ඒ මත දරුවාගේ පාසල් නොපැමිණීම සම්බන්ධවත් විදුහල්පතිතුමා දැනුවත් කර තිබියදී විදුහල්පතිතුමා විසින් ගුරුවරිය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවද පෙනී යයි. මේ අනුව චක්‍රලේඛ අංක 12/2016 මඟින් සිසුන්ට ශාරීරික දඬුවම් ලබාදිය නොහැකි බවට සියලුම පාසල්වල විදුහල්පතිවරු දැනුවත් කර ඇති අතර එකී දැනුවත් කිරීම් පාසලේ ගුරුභවතුන් වෙත ලබා දෙමින් ශාරීරික හා මානසික දඬුවම් වලින් සිසු දරුවන් ආරක්ෂා කිරීමේ පළමු වගකීම දරණ නිලධාරියා වශයෙන් පළමු වගඋත්තරකරු වන විදුහල්පති විසින් මෙකී සියලු වගකීම් පැහැර හරිමින් කටයුතු කර ඇති බව නිගමනය කරනු ලැබේ.

මේ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වූ පැමිණිලි පාර්ශවයේ හා වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම 1වන වගඋත්තරකාර පො/දිඹුලාගල සුගලාදේවී ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ.

**උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව) විසින්,**

1. දෙවන වන වග උත්තරකරු වන සෙල්ලප්පෙරුමගේ නිරක්ෂි නිලූෂිකා ශිවන්ති පෙරේරා යන අය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.
2. පළමු වගඋත්තරකරු වන චන්ද්‍රලාල් රාජපක්ෂ (විදුහල්පති) විසින් මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.
3. තෙවන වගඋත්තර පාර්ශවය වන මනම්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ වගකිව යුතු නිලධාරීන් විසින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ක්‍රියාකර ඇති ආකාරය සතුටුදායක නොවන බැවින්, එකී නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

(2026) 2026. 02. 12 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත මෙයින් දන්වා සිටිමු.

**එල්.ටී.බී. දෙහිදෙණිය,**
**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු),**
**සභාපති,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**නිමල් ජී. පුංචිහේවා,**
**කොමසාරිස්,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

නිමල් ජී. පුංචිහේවා
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :

1) අධ්‍යාපන අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල. - දැ.ගැ.ස

2) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
උතුරු මැද පළාත. - අ.ක.ස